THE
# WHITE HACKLE
වයිට් හැකල්
JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY



## GUARD OF HONOUR TO COMMANDER OF THE SRI LANKA ARMY

# EDITORS



**COLONEL OF THE REGIMENT**
Maj Gen KADA Karunasekara RWP RSP VSV USP ndu psc



**CENTRE COMMANDANT**
Brig MM Kithsiri RWP RSP USP



**DEPUTY CENTRE COMMANDANT**
Lt Col DAK Dissanayake WWV RWP RSP



**ADJUTANT RHQ SLLI**
Maj IR Hewapathirana RSP psc SLLI

### CHIEF CONSULTANT

Maj Gen KADA Karunasekara RWP RSP VSV USP ndu psc

### EDITOR IN CHIEF

Brig MM Kithsiri RWP RSP USP

### ASSISTANT EDITORS

Maj IR Hewapathirana RSP psc SLLI ( Adjutant RHQ SLLI )

Maj TMAN Thennakoon RWP SLLI (White Hackle Publication)

Maj BABR Perera SLLI (Officer in Charge )

### HONOURARY CONSULTANTS

Gen RMD Ratnayake (retd) WWV RWP RSP VSV USP ndu psc

Lt Gen HV Athukorale (retd) VSV psc FBIM

Brig AVR Abesinghe (retd) KSV

### COMPUTER TYPE SETTING & DESIGNING

L/Cpl Suranga RBP - White Hackle Publication

### PHOTOGRAPHERS

Cpl Mahindasena AGMR

Cpl Pathmasiri UDN

L/Cpl Iranga HADS


THE WHITE HACKLE
JOURNAL OF THE SRI LANKA LIGHT INFANTRY
93rd ISSUE - JULY- SEPTEMBER 2017


කතුවැකිය

## ගෙවී යන කාලය

කාලය යනු ගෙවීයන, ක්ෂය වී යන හෝ නැවත ලබාගත නොහැකි දෙයකි. සාමාන්‍යයෙන් බැලූ කළ කාලයේ වටිනාකමක් හෝ බරක් හෝ යම් විශේෂ දෙයක් නැත. එහෙත්.... අප ජීවිතයේ කළයුතු වැදගත්ම දෙය නම් මෙම කාලයට හොඳ වටිනාකමක් ඇති කරලීමයි. කාලයෙන් එක් දිනක් මිනිසුන් අතර බෙදී ගියහොත් අපට ඉතිරිවනුයේ සුළු මොහොතක් පමණි. ඒ සුළු මොහොත නියමාකාරයෙන් ප්‍රයෝජනයට ගන්නෝ කවරහුද.....?

යුද හමුදා සෙබළුන් වන අපට කාලය ඉතාමත් වැදගත් දෙයකි. මන්ද, යුද හමුදාවේ පැවැත්ම රැඳී තිබෙනුයේ මෙම කාලය මතය. එහි සෑම කාර්යයක්ම කාලය හා බැඳී පවතී. රටක දියුණුවට එය බෙහෙවින්ම බලපාන සාධකයකි. කාලයකට වැඩකරන තාලය ඇති එකම ආයතනය යුද්ධ හමුදාවයි. එහෙත් රාජකාරියේදී අපට අවශ්‍යම වන මෙම කාලය, රාජකාරිය තුල කළමණාකරණය කරගැනීම ආයතනවල වැඩකරන ලිපිකරුවන් අවශ්‍යයෙන්ම කළයුතු එකකි. මන්ද, අප විසින් සිදුකරනු ලබන රාජකාරිය නොපමාව ඉටුකිරීම තුලින් අපගේ සේවය බලාපොරොත්තුවෙන් පසු වන අපගේම සහෝදර සෙබලෙකුගේ ජීවිතයේ සාර්ථක අවස්ථාවකට පැමිණෙනු ඇත."සේවය කරමි" යන පාඨය පෙරදැරිව සිටින පාබල සොල්දාදුවන් වන අප අපගෙන් විය යුතු සේවය හිතවත්කම් වලට, මිලමුදල් වලට, අමනාපකම් වලට පාවා නොදීමට අප වගබලාගත යුතු අතර පෙර කරන ලද අතපසුවීම්, හරි වැරදි සකසාගෙන සහෝදරත්වයෙන් අනෙකාට සේවය කිරීමට අප අදිටන් කරගනිමු.

## READERS PLEASE WRITE IN

The **WHITE HACKLE** the Voice of Sri Lanka Light Infantry Regiment is now firmly established. It has reached maturity. This is the 93rd issue. This quarterly is for members of the SLLI, their families, Ex-Servicemen of SLLI, and as a whole for the entire Army. It will be extended even to all Sri Lankans.

We should not rest on our laurels. Targets have to be set. Greater goals to be achieved. The success of **"THE WHITE HACKLE"** depends on combined efforts. Everyone has his contribution to make, and every contribution is most welcome in any language (Sinhalese, Tamil, and English). What is value is our making the attempt, and then we can surely do our bit. Express your thoughts, ideas, opinions, and criticisms, hopes and fears through **" THE WHITE HACKLE "**, the journal of the oldest and proudest Regiment of them all. If you have much to say about your Battalion's experience, go ahead and write into **" THE WHITE HACKLE "** we are willing to accept and publish. We are happy to hear you and consider your contribution in any form; sketches, cartoons, stories, poems and whatever comes from your thoughts and your pen.

Our Motto is **" Ich Dien", " I Serve"**. Let **" THE WHITE HACKLE "** be a way to serve each other, our Regiment and our country with our banner flying high as it always will. Wishing you all the very best.

-Editor-

# මෙවර කලාපයෙන්

ජූලි - සැප්තැම්බර්
2017

# WHITE HACKLE

## Top Five



1 යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරල් එන්යුඑම්එම්ඩබ්ලිව් සේනානායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යුඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් සුරතින් රෙම ශ්‍රීලපාහ ගෘහස්ථ ක්‍රීඩාංගනය විවෘත කිරීම



2 යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන මේජර් ජෙනරල් කේඒඩීඒ කරුණාසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යුඑස්පී එන්ඩීයු පීඑස්ස ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන්ගේ සංචාරය



3 මේජර් ජෙනරල් ආර්ඒ නුගේරා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යුඑස්පී එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ රෙජිමේන්තු සංචාරය



4 මේජර් ජෙනරල් එල්එම් මුදලිගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන්ගේ සංචාරය



5 මේජර් ජෙනරල් ඒඑල්එස්කේ පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යුඑස්පී එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලදාරි තුමන්ගේ සංචාරය

## රෙම ශ්‍රීලපාහ පුවත්


02 සුභ මොහොතින් නව තනතුරුවලට පත් වූ නිලධාරීන් සහ සෙසුනිලයින්

03 අභිනවයෙන් ඉදි වූ රෙම ශ්‍රීලපාහ නව ගෘහස්ත ක්‍රීඩාගාරය යුද්ධ හමුදාධිපති තුමන් සුරතින් විවෘත වූ වගයි.

05 ශ්‍රී ලංකා පාබල හමුදාවෙන් බිහිවූ 12 වැනි යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන තුමන්ගේ රෙම ශ්‍රීලපාහ සංචාරය

07 මේජර් ජෙනරල් ආර්ඒ නුගේරා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යුඑස්පී එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ රෙජිමේන්තු සංචාරය

08 මේජර් ජෙනරල් එල්එම් මුදලිගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන්ගේ සංචාරය

09 මේජර් ජෙනරල් ඒඑල්එස්කේ පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යුඑස්පී එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන්ගේ සංචාරය

10 ශ්‍රී ලංකා පාබල හමුදා වර්ණ ප්‍රදානෝත්සවය 2017

13 අණ හා මාණ්ඩලික පාඨමාලාව 2018 වර්ෂය සඳහා තේරී පත්වූ ශ්‍රීලපාහ නිලධාරීන්


## සේවා වනිතා පුවත්


14 වෛද්‍යාධාර හා ක්‍රීඩා කටයුතු සඳහා මූලයාධාර පිරිනැමීම


## ක්‍රීඩා පුවත්


15 ශ්‍රීලපාහ ක්‍රීඩකයින් දැක්වූ ක්‍රීඩා දක්ෂතා සහ ජයග්‍රහණ


## විශේෂාංග


16 ආචාර්ය අබ්දුල් කලාම්


## බළඇණි පුවත්


17 1 ශ්‍රීලපාහ බළඇණි පුහුණුවීම්

19 53 සේමු අභියෝගතා කුසලාන ක්‍රීඩා තරඟාවලියේ අනුශූරතාවය ලැබූ 4 ශ්‍රීලපාහ

21 ප්‍රතිත්‍රස්ත යුද උපක්‍රම පාඨමාලාවේ නිලධාරීන්ගේ 7 ශ්‍රීලපාහ කඳවුරු සංචාරය

23 8 ශ්‍රීලපාහ ඒකකයේ දහතුන් වන සංවත්සරය

25 9(සෙව්) ශ්‍රීලපාහ ප්‍රථම විශ්‍රාමික සුහද හමුව

27 විශේෂ පාබල ක්‍රියාන්විත පුහුණු පාඨමාලාවේ ජයග්‍රහණ හිමිකරගත් 10 ශ්‍රීලපාහ

28 දුම්වැටියෙන් තොර නිදහස් කලාපයක් බවට පත්වෙමින් තිබෙන 12 ශ්‍රීලපාහ කඳවුරු පරිශ්‍රය

29 14(සෙව්) ශ්‍රීලපාහ ඒකකයේ නව සෙසුනිල භෝජනාගාරයට මුල්ගල තැබීම

30 15 ශ්‍රීලපාහ බළඇණි පුහුණුවීම්

32 16 (සෙව්) ශ්‍රීලපාහ බළඇණි පුහුණුවීම්

33 අංක 72 බලඇණි ආධාරක අවි පාඨමාලාවේ ප්‍රථම ස්ථානය 19 ශ්‍රීලපාහ

34 පුහුණුවෙන් ලද නිපුණත්වයෙන් අභිමානය රැකගත් 20 ශ්‍රීලපාහ

35 23 ශ්‍රීලපාහ බළඇණි දින සැමරුමට ලේ පරිත්‍යාගයක්

36 තනතුරෙන් නික්ම යන වන්නි ආඥාපති වෙත 24 ශ්‍රීලපාහ උත්තමාචාරය පිරිනැමීම


37 අන්තර් ඒකක එල්ලේ තරඟාවලියේ විශිෂ්ඨයන් වූ 25 ශ්‍රීලපාහ


## විවිධ


38 උපන්දින සුභපැතුම්

39 ප්‍රහේලිකා

31 දසුනේ හසුන


## කවරයේ කථාව

2017 අගෝස්තු මස 23 වන දින ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු ගෘහස්ථ ක්‍රීඩාගාරය විවෘත කිරීමට සපැමිණි යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරල් එන්යූ එම්එම්ඩබ්ලිව් සේනානායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යුඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් වෙත ලබාදුන් සම්මාන පෙළපාලියේදී ශ්‍රීලපාහ වර්ණ ධජයට ආචාර පුද කිරීම සිදු කල අවස්ථාව


**PRINTING & PUBLISHING**

**REGIMENTAL CENTRE SRI LANKA LIGHT INFANTRY**

**Telephone**- 0112855204 / 0112855357 - 59

**Ext**-57656 **Fax**- 0112855204

**E-mail**-editor.whitehackle@gmail.com

**Website**- www.army.lk/lightinfantry

# සුබ මොහොතින් නව තනතුරට පත්වූ ඔබට
# රෙජිමේන්තු අධිපති ඇතුලු සියලු නිලයින්ගේ උණුසුම් සුභපැතුම් !



නියෝජ්‍ය සේනාවිධායක රෙම ශ්‍රීලපාහ
නි/61688 ලුතිතන් කර්නල් ඩීජීකේ දිසානායක ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී



අණදෙන නිලධාරි 6 ශ්‍රීලපාහ
නි/64096 මේජර් එච්ඩබ්ලිව්ආර්
සංජීව ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ



විධායක අධිකාරි රෙම ශ්‍රීලපාහ
නි/64316 මේජර්
අයිආර් හේවාපතිරණ
ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ



මානි 11 හකාස රෙම ශ්‍රීලපාහ
නි/64049
මේජර් ඒඑන් ද සිල්වා ශ්‍රීලපාහ



2 වන අණදෙන නිලධාරි
15 ශ්‍රීලපාහ
නි/65025 මේජර් ආර්එස්කේ
රත්නායක ආර්එස්පී ශ්‍රීලපාහ



විධායක අධිකාරි 24 ශ්‍රීලපාහ
නි/68917 කපිතන් බිජීඒඅයිබි
ගුණසේකර ශ්‍රීලපාහ



බුද්ධි නිලධාරි 20 ශ්‍රීලපාහ
නි/68909 කපිතන්
එම්එච්පී මදුරංග ශ්‍රීලපාහ



විධායක අධිකාරි 23 ශ්‍රීලපාහ
නි/69295 කපිතන්
එම්ටීඑන් ප්‍රේමසිරි ශ්‍රීලපාහ



විධායක අධිකාරි 1 ශ්‍රීලපාහ
නි/69611
ලුතිතන් පීඑච්එස් චින්තක ශ්‍රීලපාහ



රෙසැමේ රෙම ශ්‍රීලපාහ
සෙ/303104 ඔනි I
එම්ජීඑස් මහේෂ් කුමාර



රෙසැමේ 23 ශ්‍රීලපාහ
සෙ/312259 ඔනි I
පීඑන් පියසේන



රෙසැමේ 20 ශ්‍රීලපාහ
සෙ/314423 ඔනි I
එස්පිඩි නිලන්ත කුමාර



රෙදපාසැමේ 11 ශ්‍රීලපාහ
සෙ/313252 ඔනි II
සත්කුමාර කේටීආර්ජේ




රෙදපාසැමේ 20 ශ්‍රීලපාහ
සෙ/311707 ඔනි II
සියරත්න බංඩා කේ (ආර්එස්පි)



සරඹ උපදේශක 24 ශ්‍රීලපාහ
සෙ/315374 ඔනි II
පුෂ්පකුමාර ආර්එම්එස්එන්



සරඹ උපදේශක 2(සෙවි) ශ්‍රීලපාහ
සෙ/2ඩී02659 ව/සැරයන්
ජයවර්ධන ඩබ්ලිව්කේඑස්



සරඹ උපදේශක 7 ශ්‍රීලපාහ
සෙ/315376 ව/සැරයන්
දිසානායක ඩිකේආර් (ආර්එස්පි)



ප්‍රධාන ලිපිකරු 23 ශ්‍රීලපාහ
සෙ/317237 ව/සැරයන්
සම්පත් එම්වීඑස් (ආර්එස්පි)

# අභිනවයෙන් ඉදි වූ රෙම ශ්‍රීලපාහ නව ගෘහස්ත ක්‍රීඩාගාරය යුද්ධ හමුදාධිපති තුමන් සුරතින් විවෘත වූ වගයි.



**වයිට් හැකල් ප්‍රකාශන අංශය විසිනි**

නවතමයෙන් ඉදිකරන ලද රෙම ශ්‍රීලපාහ ගෘහස්ථ ක්‍රීඩාගාරය විවෘත කිරීම සඳහා ශ්‍රී ලංකා යුද හමුදා මාණ්ඩලික ප්‍රධාන හා ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරල් කේඩීඒ කරුණාසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන්ගේ ආරාධනයෙන් 2017.08.23 දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරල් එන්යූඑම්එම්ඩබ්ලිව් සේනානායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් පාබල හමුදා රෙජිමේන්තුව වෙත පැමිණෙන ලදී.

රෙජි අධිපති තුමන් විසින් යුද්ධ හමුදාධිපති තුමන් මහත් හරසරින් යුතුව පිළිගැනීමෙන් අනතුරුව එතුමන් හට සම්මාන මුරයක් හා සම්මාන පෙළපාලියක් පිරිනමන ලද අතර, යුද්ධ හමුදාධිපති තුමන් ශ්‍රී ලංකා පාබල හමුදා අභිමන් මුදුනත හෙවත් රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝපහාර දැක්වීමෙන් අනතුරුව එදිනට යෙදුන සුභ මොහොතින් නව ගෘහස්ථ ක්‍රීඩාගාරය විවෘත කරන ලදි. නව ගෘහස්ථ ක්‍රීඩාංගනයේදී ශ්‍රීලපාහ රෙජිමේන්තු කණ්ඩායම් අතර ප්‍රදර්ශනාත්මක බැඩ්මින්ටන් තරඟාවලියක් පැවැත්වීමෙන් පසු යුද්ධ හමුදාධිපති තුමන් භට පිරිස් අමතන ලදී. එහිදී වර්තමාන යුද හමුදාවේ සාමූහිකත්වයෙන් වැඩකිරීම, විනය පවත්වා ගැනීම මෙන්ම බුද්ධිමත්ව කටයුතු කිරීම වැනි උපදේශනාත්මක කරුණු ඇතුළත් හරවත් දේශනයක් එතුමන් විසින් සිදුකරන ලදී.

රෙජිමේන්තු අධිපති තුමන්ගේ සංකල්පයකට අනුව නියෝජ්‍ය සේනාවිධායක කර්නල් පීඑම්එන් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් 2016 මාර්තු මස 17 වන දින පෙව 11.27 පැයට යෙදුන සුභ මොහොතින් රෙම ශ්‍රීලපාහ නිලධාරි නිවස්නය ඉදිරිපිට නව ගෘහස්ථ ක්‍රීඩාගාරය සඳහා මුල් ගල තබා ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලදී. මෙම ගෘහස්ථ ක්‍රීඩාගාරයේ ඉදිකිරීම් කටයුතු සඳහා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එම්එම් කිත්සිරි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ජ්‍යෙෂ්ඨ





නිලධාරි තුමන්ගේ මඟපෙන්වීම මත මධ්‍යස්ථාන නියෝජ්‍ය සේනාවිධායක කර්නල් පීඑම්එන් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී තුමන්ගේ පූර්ණ අධීක්ෂණයෙන් සිදුකරන ලදි. මෙම ගෘහස්ථ ක්‍රීඩාගාරයේ ඉදිකිරීම් කටයුතු සඳහා 4 ශ්‍රීලපාහ හිටපු අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ජේකේආර්පී ජයසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ විසින් මූලිකත්වය ගෙන තම බළඇණියේ භට පිරිස් යොදවා ඉදිකිරීම් ආරම්භ කිරීමෙන් පසු එම බළඇණියේ වත්මන් අණදෙන නිලධාරි මේජර් ටීකේඩී ධර්මසේන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විසින් ගෘහස්ථ ක්‍රීඩාගාරයේ වැඩ කටයුතු අවසන් වන තෙක් තම භට පිරිස් සහය ලබාදෙමින් අගනා මෙහෙයක් සිදු කරන ලදි. මෙම අණදෙන නිලධාරීවරුන් දෙදෙනා හට ඔවුන් ලබාදුන් මෙහෙවර වෙනුවෙන් රෙජිමේන්තු අධිපති තුමන් ප්‍රමුඛ සියලු නිලයින්ගේ කෘතඥතා පූර්වක ස්තූතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කරගනු ලබන අතර, මෙම උත්සව අවස්ථාව සඳහා ශ්‍රීලපාහ මහ කාරක සභාවට අයත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ඇතුලු ජ්‍යෙෂ්ඨ සහ කණිෂ්ඨ නිලධාරීන් මෙන්ම, රෙසැමේ ඇතුලු සෙසුනිලයන් විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් පැවැත්විය.











# ශ්‍රී ලංකා පාබල හමුදාවෙන් බිහිවූ 12 වැනි යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන තුමන්ගේ රෙම ශ්‍රීලපාහ සංචාරය

**ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරල් කේඒඩීඒ කරුණාසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නව මාණ්ඩලික ප්‍රධාන තනතුරට පත්වීමෙන් පසු 2017.08.10 වන දින ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානට සපැමිණීම නිමිත්තෙන් මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එම්එම් කිත්සිරි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් විසින් සාදරයෙන් පිළිගැනීමෙන් පසු අභිමානවත් සම්මාන මුරයක් හා සම්මාන පෙළපාලියක් එතුමන් හට පුද කරන ලදී.**



**වයිට් හැකල් ප්‍රකාශන අංශය විසිනි**

රෙජිමේන්තු මධ්‍යස්ථානයට පැමිනි යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන තුමන් මෙම තනතුර දැරීමට ප්‍රථමයෙන් ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති ධුරයට අමතරව ආසේමු (කිළි) ආඥාපති හා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ සේනාවිධායක තනතුරු හොබවමින් විශිෂ්ඨ සේවාවක් ඉටුකරන ලදි. මෙතෙක් එතුමන් පැමිනි යුද හමුදා ගමන් මගෙහි තම දැනුම් සම්භාරය හා අත්දැකීම් වර්ධනය කරගනිමින් තම පසුපෙළ වෙත ආදර්ශවත් නායකත්වයක් ලබා දෙන ලදී. සම්මාන පෙළපාලියට තම ආචාරය ලබාදුන් නව යුද



හමුදා මාණ්ඩලික ප්‍රධාන තුමන් පාබල හමුදා අභිමන් මුදුනත වෙත ගොස් මියගිය රණවිරුවන් සිහිකර තම ආචාරය ඔවුන් වෙත පුදකිරීමට ද අමතක නොකරන ලදී. පසුව කොනොනි සමාජ ශාලාවේ එතුමන් වෙනුවෙන් සකසන ලද තේපැන් සංග්‍රය භුක්තිවිඳ සියලු නිලයින් අමතා හරවත් දේශනයක් සිදු කර නිලධාරි සමූහ ඡායාරූපයකට හා රෙසැමේ ප්‍රමුඛ බනිසැර නිවස්න සාමාජිකයින් සමඟ සමූහ ඡායාරූපයකට පෙනී සිටීමෙන් අනතුරුව සංචාරය නිමාවට පත්කරන ලදී. මෙම උත්සව අවස්ථාව රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එම්එම් කිත්සිරි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී තුමන්ගේ මඟපෙන්වීම මත නියෝජ්‍ය සේනාවිධායක කර්නල් පීඑම්එන් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී තුමන්ගේ පූර්ණ අධීක්ෂණයෙන් සිදුකරන ලද අතර, රෙම ශ්‍රීලපාහ මහකාරකසභාවට අයත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ද, නිලධාරීන්ද, රෙසැමේ ඇතුලු සියලුම නිලයින්ද මෙම අවස්ථාවට සහභාගී විය. නව යුද හමුදා මාණ්ඩලික ප්‍රධාන නතතුරින් පිදුම් ලැබූ ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමණි ඔබගේ යුද හමුදා දිවිය සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවා යැයි ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවේ සියලු නිලයින් මෙසේ ආශිර්වාදය පුදකරන්නෙමු.









# මේජර් ජෙනරල් නිලයට උසස්වීම් ලැබූ පාබල හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ රෙම ශ්‍රීලපාහ සංචාර

## මේජර් ජෙනරල් ආර්ඒ නුගේරා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යුඑස්පී එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ රෙපිමේන්තු සංචාරය

වයිට් හැකල් ප්‍රකාශන අංශය විසිනි



මේජර් ජෙනරල් නිලයට නිල උසස්වීම් ලැබූ මේජර් ජෙනරල් ආර්ඒ නුගේරා ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යුඑස්පී එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් 2016.11.28 වන දින රෙම ශ්‍රීලපාහ වෙත කළ ප්‍රථම සංචාරයේදී මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එම්එම් කිත්සිරි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යුඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් විසින් මහත් හරසරින් පිළිගන්නා ලදී.

කොළඹ ශාන්ත පීතර විද්‍යාලයෙන් සිප්සතර හැදෑරූ දීප්තිමත් ශිෂ්‍යයෙකු ලෙස සහ එම විද්‍යාලයේම දක්ෂ ක්‍රිකට් ක්‍රීඩකයෙකු ලෙස ද දස්කම්පා පාසල් දිවිය නිමකර රටේ ඒකීයභාවය හා භෞමික අඛණ්ඩතාවය සුරැකීම වස් 1985.06.10 වන දින ආධුනික කෙඩෙට් නිලධාරියෙකු වශයෙන් නිත්‍ය කෙඩෙට් නිලධාරි පාඨමාලා අංක 21 යටතේ කෙඩෙට් නිලධාරි පාඨමාලාව හදාරමින් දෙවන ලුතිතන් නිලයෙන් අධිකාරියට පත්ව ශ්‍රී ලංකා පාබල හමුදා රෙපිමේන්තුවේ 3 ශ්‍රීලපාහ ඒකකයට ඇතුළත්ව එම ඒකකයේ කණ්ඩභාර නිලධාරි තනතුරේ සිට එම බලඇණියේ අණදෙන නිලධාරි තනතුර දක්වා තනතුරු හොබවන ලදී.

ශ්‍රී ලංකා යුද හමුදාව මගින් දියත් කරන ලද ජයසිකුරු, රිවිබල, රණගොස I, II, III, IV, වැලිකතර, රිවිකිරණ I, කිණිහිර VII, VIII, අග්නි කීල I, II, III, සහ පීරා සෙවීමේ ක්‍රියාන්විත සඳහා තම බළඇණියට දක්ෂ නායකත්වයක් ලබාදෙන ලදී.

මාදුරුඔය පුහුණු පාසලේ ප්‍රධාන උපදේශක වශයෙන් ද, පාපුම මින්නේරියහි සේනාවිධායක ලෙසද, රාජකාරි කරන ලදී. දේශිය පාඨමාලාවන් රැසක් හදාරා ඇති මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරි ඉන්දියාව, පකිස්තානය, චීනය, හවායි, සිංගප්පූරුව, ඇමරිකාව යන රටවල විදේශීය පාඨමාලාවන් රැසක් ද හදාරා ඇත.

මෙම අභීත සෙන්පති යාන්ත්‍රික පාබල රෙපිමේන්තුව බිහිකිරීම උදෙසා පූර්ණ දායකත්වය ලබාදුන් අතර 534 බසේමු හා කමාණ්ඩෝ බළසේනාවේ බලසේනාධිපති වශයෙන් ද, යුධ හමුදා පුහුණු අධ්‍යක්ෂක ලෙස ද,12 සහ 23 වන සේනාංකවල සේනාංකාධිපති ලෙස ද, රාජකාරි කිරීමෙන් පසු වත්මන් කමාන්ඩෝ රෙපිමේන්තු අධිපති ලෙස හා 14 වන සේනාංකයේ සේනාංකාධිපති ලෙස කටයුතු කරනු ලබයි.

රෙපිමේන්තුවට පැමිණි මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරි වෙත සම්මාන මුරයක් හා සම්මාන පෙළපාලියක් පිරිනැමීමෙන් අනතුරුව රණවිරු ස්මාරකය වෙත ගොස් පුෂ්පෝපහාර දක්වා පසුව කොනොනි සමාජ ශාලාවේ පිළියෙල කරන ලද තේපැන් සංග්‍රහය භුක්ති විඳ සියලු නිලයින් අමතා හරවත් දේශනයක් සිදුකරමින් සංචාරය නිමාකරන ලදී.

මෙම උත්සව අවස්ථාව රෙපිමේන්තු මධ්‍යස්ථාන නියෝජ්‍ය සේනාවිධායක කර්නල් පීඑම්එන් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ පූර්ණ අධීක්ෂණයෙන් සිදුකරන ලද අතර, රෙම ශ්‍රීලපාහ මහකාරක සභාවට අයත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ද, නිලධාරින්ද රෙසැමේ ඇතුලු සියලුම නිලයින්ද මෙම අවස්ථාවට සහභාගී විය.



# මේජර් ජෙනරල් එල්එම් මුදලිගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන්ගේ සංචාරය

වයිට් හැකල් ප්‍රකාශන අංශය විසිනි



මේජර් ජෙනරල් නිලයට උසස්වීම් ලැබූ මේජර් ජෙනරල් එල්එම් මුදලිගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් 2017.05.19 වන දින රෙම ශ්‍රීලපාහ සංචාරයේදී මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එම්එම් කිත්සිරි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් විසින් සාදරයෙන් පිළිගන්නා ලදී.

කළුතර මහ විද්‍යාලයෙන් සහ ගාල්ල මහින්ද විද්‍යාලයෙන් සිප්සතර හදාරා රටේ පැවති කුරිරු ත්‍රස්තවාදය මැඩලීම සඳහා තම තරුණ ජවය කැප කරමින් 1985 ජුනි මස 06 වන දින ශ්‍රී ලංකා යුද හමුදා නිත්‍ය බලසේනාවේ ආධුනික කෙඩෙට් නිලධාරියෙකු වශයෙන් පාඨමාලා අංක 21 යටතේ ශ්‍රී ලංකා යුද හමුදා විද්‍යාපීඨය වෙතින් සාර්ථකව කෙඩෙට් නිලධාරි පාඨමාලාව හදාරා 1986 ජනවාරි 25 වන දින දෙවන ලුතිතන්වරයෙකු ලෙස අධිකාරිය ලබා 3 ශ්‍රීලපාහ වෙත ඇතුළත්වන ලදී.

එම ඒකකයේ කණ්ඩභාර නිලධාරියෙකු වශයෙන් ද, 4 හා 6 ශ්‍රීලපාහ ඒකකවල කණ්ඩායම් භාර නිලධාරි වශයෙන් ද, 6 ශ්‍රීලපාහ ඒකකයේ දෙවන අණදෙන නිලධාරි වශයෙන් ද එම ඒකකයේම වැඩබලන අණදෙන නිලධාරි වශයෙන් ද රෙම ශ්‍රීලපාහ අණ හා පාලන කණ්ඩායමේ නිලධාරි අණදෙන වශයෙන් ද, 4 ශ්‍රීලපාහ ඒකකයේ වැඩබලන අණදෙන නිලධාරි වශයෙන්ද, රෙපිමුබ ශ්‍රීලපාහ ඒකකයේ අණදෙන නිලධාරි වශයෙන්ද රාජකාරි කරමින් ලබාගත් අත්දැකීම් තුලින් 51 සේනාංකයේ කර්නල් (ප්‍රමානි), එජාසාසාබ පුහුණු පාසලේ සේනාවිධායක, කොනොනි පුහුණු පාසලේ සේනාවිධායක, 234 බසේමු බලසේනාධිපති, 53 හා 59 සේනාංකවල වැඩබලන සේනාංකාධිපති ලෙස රාජකාරි කළ අතර, 24 සේනාංකයේ සේනාංකාධිපති වශයෙන් දැනට කටයුතු කරනු ලබයි.



දේශීය පාඨමාලාවන් රැසක් හදාරා ඇති මෙතුමා ඉන්දියාව, බංගලාදේශය, රුසියාව , පකිස්තානය යන රටවල විදේශ පාඨමාලා රැසක් ද සාර්ථකව හදාරා ඇත. තවද මෙතුමන් විසින් නායකත්වය ලබාදුන් ක්‍රියාන්විත අතර, වඩමාරච්චි, ටයිගර් හන්ටර්, බලවේගය, වාලම්පුරි, රිවිරැස, ජයසිකුරු, රණඝොස, කිණිහිර, අග්නිකීල යන ක්‍රියාන්විත විශේෂ තැනක් ගනී.

නිල උසස්වීමෙන් පසු රෙම ශ්‍රීලපාහ වෙත පැමිණි මෙතුමන් වෙත සම්මාන මුරයක් හා සම්මාන පෙළපාලියක් ලබාදීමෙන් පසු රණවිරු ස්මාරකය වෙත පුෂ්පෝපහාර දැක්වීමෙන් අනතුරුව තේපැන් සංග්‍රහයක් භුක්ති විඳ සියලුම නිලයින් අමතා තම සංචාරය නිම කරන ලදී. මෙම උත්සව අවස්ථාව රෙපිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක තුමන්ගේ මඟපෙන්වීම මත නියෝජ්‍ය සේනාවිධායක තුමන්ගේ පූර්ණ අධීක්ෂණයෙන් සිදුකරන ලද අතර, රෙම ශ්‍රීලපාහ මහකාරක සභාවට අයත් ජ්‍යෙෂ්ඨ නිලධාරින් ද, නිලධාරින් ද රෙසැමේ ඇතුලු සියලුම නිලයින්ද මෙම අවස්ථාවට සහභාගී විය.

# මේජර් ජෙනරල් ඒඑල්එස්කේ පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන්ගේ සංචාරය

**වයිට් හැකල් ප්‍රකාශන අංශය විසිනි**



නිල උසස්වීම් ලැබ 2017.06.20 වන දින තම ප්‍රථම සංචාරය සිදුකරමින් ශ්‍රීලපාහ රෙජිමේන්තු මධ්‍යස්ථානයට පැමිණි මේජර් ජෙනරල් ඒඑල්එස්කේ පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයු ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එම්එම් කිත්සිරි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ජ්‍යෂ්ඨ නිලධාරි තුමන් විසින් සාදරයෙන් පිළිගන්නා ලදී.

පානදුර ශ්‍රී සුමංගල පිරිමි මහා විද්‍යාලය වෙතින් අධ්‍යාපනය හදාරා මව්බිමේ ඒකීයභාවය හා භෞමික අඛණ්ඩතාවය සුරැකීම වස් 1985.06.10 වන දින ශ්‍රී ලංකා යුද හමුදාවට ආධුනික කෙඩෙට් නිලධාරියෙකු ලෙස බැඳී යුද හමුදා විද්‍යාපීඨයෙන් පාඨමාලා අංක 21 ඒ යටතේ කෙනි පාඨමාලාව හදාරා 1986.09.02 වන දින දෙවන ලුතිතන්වරයෙකු ලෙස අධිකාරියට පත්ව 3 ශ්‍රීලපාහ ඒකකයට අතුලත් වන ලදී. එම ඒකකයේ කණ්ඩභාර නිලධාරි හා නිලධාරි අණදෙන ලෙස රාජකාරි ගමන් මඟ අරඹමින් යුද හමුදා විද්‍යාපීඨයේ පාඨමාලා උපදේශක, 8 ශ්‍රීලපාහ ඒකකයේ දෙවන අණදෙන නිලධාරි, මාදුරුඔය යුහ පුහුණු පාසලේ ප්‍රධාන උපදේශක, 8 ශ්‍රීලපාහ ඒකකයේ වැඩබලන අණදෙන නිලධාරි, 6 ශ්‍රීලපාහ ඒකකයේ අණදෙන නිලධාරි, එජාසාසාබ පළමු බලඇණියේ දෙවන අණදෙන නිලධාරි හා හයවන එක්සත් ජාතීන්ගේ සාමසාධක බලඇණියේ අණදෙන නිලධාරි ලෙසද, 521, 231 හා 553 බසේමු හි බලසේනාධිපති, රෙම ශ්‍රීලපාහ සේනාවිධායක, 53 හා 55 සේනාංකවල සේනාංකාධිපති, පාපුම මින්නේරිය හා එජාසාසාබ පුහුණු පාසලේ සේනාවිධායක, තුර්කි රාජ්‍යයේ ශ්‍රී ලංකාව නියෝජනය කරන ආරක්ෂක සේවා නියෝජිතයා වශයෙන් ද තම රාජකාරි ඉටුකළ අතර, ශ්‍රී ලංකා යුද හමුදා පිරිස් පාලන අධ්‍යක්ෂක වශයෙන් දැනට රාජකාරි කරනු ලබයි.



දේශීය පාඨමාලාවන් රැසක් හදාරා ඇති මෙතුමන් ඉන්දියාව , නැම්බියාව, එක්සත් රාජධානිය, පකිස්තානය වැනි රටවල විදේශ පාඨමාලා රැසක් හදාරා ඇත. තවද, වඩමාරච්චි, ජයශක්ති, වන්නිවික්‍රම, බලවේගය, යාල්දේවි, රිවිරැස, සත්ජය, ජයසිකුරැ, එඩිබල, රණඝොස සහ උතුරැ නැගෙනහිර මානුෂීය මෙහෙයුම සඳහා තම සක්‍රීය දායකත්වය ලබාදී ඇත. රෙම ශ්‍රීලපාහ වෙත පැමිණි මෙතුමන් වෙත සම්මාන මුරයක් හා සම්මාන පෙළපාලියක් පිරිනැමීමෙන් අනතුරුව රණවිරු ස්මාරකය වෙත ගොස් පුෂ්පෝපහාර දැක්වීමෙන් පසු කොනොනි සමාජ ශාලාවේ පිළියෙල කරන ලද තේපැන් සංග්‍රහය භුක්ති විඳ සියලු නිලයින් අමතා හරවත් දේශනයක් සිදුකර තම සංචාරය නිමාකරන ලදී.

මෙම උත්සව අවස්ථාව රෙජිමේන්තු මධ්‍යස්ථාන නියෝජ්‍ය සේනාවිධායක කර්නල් පීඑම්එන් පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ජ්‍යෂ්ඨ නිලධාරි තුමන්ගේ පූර්ණ අධීක්ෂණයෙන් සිදුකරන ලද අතර, රෙම ශ්‍රීලපාහ මහකාරක සභාවට අයත් ජ්‍යෂ්ඨ නිලධාරීන්ද, නිලධාරීන්ද රෙසැමේ ඇතුලු සියලුම නිලයින්ද මෙම අවස්ථාවට සහභාගී විය.

# ශ්‍රී ලංකා පාබල හමුදා වර්ණ ප්‍රදානෝත්සවය 2017

වයිට් හැකල් ප්‍රකාශන අංශය විසිනි




ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු මධ්‍යස්ථානයට අයත් ක්‍රීඩකයින්ගේ ක්‍රීඩා කෞෂල්‍ය ඔප්නැංවීම සහ ඔවුන්ගේ ක්‍රීඩාවට ඇති ලැදියාව, උනන්දුව වෙනුවෙන් සහ දෙස්/විදෙස් කෙලිබිම ජයගැනීම සඳහා ඔවුන් දිරිමත් කිරීම වෙනුවෙන් 2014 වර්ෂයෙන් පසුව දෙස්/විදෙස් කෙලිබිම ජයගන්නා ලද ක්‍රීඩකයින් 153 දෙනෙකු වෙනුවෙන් පවත්වන ලද ශ්‍රී ලංකා පාබල හමුදා වර්ණ රාත්‍රිය 2017 සැප්තැම්බර් මස 12 වන දින කොළඹ ආරක්ෂක විද්‍යාලීය ශ්‍රවණාගාරයේදී පැවැත්විණ.





මෙම උත්සව අවස්ථාව සඳහා යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධාන හා ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරල් කේඒඩීඒ කරුණාසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් විසින් කරන ලද ගෞරවනීය ආරාධනයෙන් ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් සපැමිණි ශ්‍රී ලංකා යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරල් එන්යූඑම්එම්ඩබ්ලිව් සේනානායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන්ව සාදරයෙන් පිළිගන්නා ලදී.

2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා කරාතේ ක්‍රීඩා ඉසව්ව තුලින් ලබා ගන්නා ජයග්‍රහණ වෙනුවෙන් 23 ශ්‍රීලපාහ ඒකකයේ සෙ/330701 ලාකෝ දිල්ෂාන් ඊඒඑන් "දක්ෂතම ක්‍රීඩකයා" ලෙස ද, 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා පැරා මලල ක්‍රීඩාව තුලින් ලබා ගන්නා ලද ජයග්‍රහණ වෙනුවෙන් රෙජිමුඛ ශ්‍රීලපාහ ඒකකයට අයත් සෙ/332977 කෝප්‍රල් වීරසිංහ ආර්එම්කේකේආර් යන ක්‍රීඩකයා වර්ණ රාත්‍රියේ "දක්ෂතම පැරා මලල ක්‍රීඩකයා" ලෙසින් යුද්ධ හමුදාධිපති තුමන් අතින් ශ්‍රී ලංකා පාබල හමුදා වර්ණ සහ සහතික පත් හිමි කර ගන්නා ලදී.

මෙම උත්සවයේ ප්‍රධාන සංවිධායක ලෙස මේජර් ජෙනරල් ඒඑල්එස්කේ පෙරේරා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් කටයුතු කළ අතර, රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එම්එම් කිත්සිරි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන්ගේ මඟපෙන්වීම සහ පූර්ණ අධීක්ෂණය යටතේ සාර්ථකව නිම කර ගැනීමට හැකි වු අතර, මෙම වර්ණ රාත්‍රිය සඳහා යුද්ධ හමුදා නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධාන තුමන් ඇතුලු යුද්ධ හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක්ද, ශ්‍රීලපාහ මහකාරක සභාවට අයත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් රැසක් සහ අනෙකුත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, නිලධාරීන්, රෙසැමේ  ඇතුලු සෙසුනිලයින් විශාල පිරිසක් හා වර්ණ ලබා ගැනීම සඳහා පැමිණි ක්‍රීඩකයින්ගේ පවුල්වල සමාජිකයින් රැසක්ද මෙම වර්ණ රාත්‍රිය සඳහා සහභාගී විය.














වේදිකාව හැඩ කළ යුද හමුදා නර්ථන කණ්ඩායම




දක්‍ෂතම ක්‍රීඩකයා
සෙ/330701 ලාකෝ දිල්ශාන් ඊඒචන්



මිහිර සිරිතිලක කලාකරුවා
පැමිණ සිටි පිරිස විනෝදමත් කරමින්...



මේරියන්ස් නායක නලින් පෙරේරා කලාකරුවා
වර්ණ රාත්‍රියට සංගීතාස්වාදය එක්කරමින්...








# අණ හා මාණ්ඩලික පාඨමාලාව 2018 වර්ෂය සඳහා තේරීපත්වූ ශ්‍රීලපාහ නිලධාරීන් හට අපගේ උණුසුම් සුභ පැතුම්

**වයිට් හැකල් ප්‍රකාශන අංශය විසිනි**

ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති තුමන්ගේ හා සේනාවිධායක තුමන්ගේ මඟපෙන්වීම මත අණ හා මාණ්ඩලික විද්‍යාලයට ඇතුලත් වීමේ විභාගය සඳහා පවත්වනු ලැබූ පුණරීක්ෂණ වැඩමුළුව 2017.06.03 වන දින 7 ශ්‍රීලපාහ බළඇණියේදී ආරම්භ කරන ලදී. ශ්‍රීලපාහ රෙජිමේන්තු මධ්‍යස්ථානයේ ප්‍රමානි I ලුතිතන් කර්නල් එස් විජේසිරිවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ සහ මානි II (ප්‍ර) මේජර් පීපීසීඑස් දොළමුල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ යන ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් මෙම පාඨමාලාව සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී. මෙහිදී යුද උපක්‍රම, හඨ කාර්යය සම්පාදන, වත්මන් සිදුවීම් සහ යුද සැළසුම් වැනි විෂයයන් තුලින් ශිෂ්‍යය නිලධාරීන් හට මනා දැනුමක් ලැබිණි. මෙම වැඩමුළුවේ සාර්ථකත්වය උදෙසා 10 ශ්‍රීලපාහ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එම්ඩීඑස්එන් කරුණාරත්න පීඑස්සී ශ්‍රීලපාහ, 20 ශ්‍රීලපාහ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ටීඩබ්ලිව්පීඩීඑම් අමරසිංහ ආර්ඩබ්ලිව්පී පීඑස්සී ශ්‍රීලපාහ, 7 ශ්‍රීලපාහ අණදෙන නිලධාරි මේජර් එම්ටීඅයි ගුණවර්ධන ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ සහ 7 ශ්‍රීලපාහ දෙවන අණදෙන නිලධාරි මේජර් අයිආර් හේවාපතිරණ ආර්එස්පී පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් දේශන පැවැත්විය. මෙම පුණරීක්ෂණ වැඩමුළුවේ ප්‍රථිපලයක් ලෙස මේජර් එස්එන් හල්වතුර ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ, මේජර් ඒඑම්එල්කේ ගුණතිලක ආර්එස්පී ශ්‍රීලපාහ, මේජර් කේබී කුළතුංග ආර්එස්පී ශ්‍රීලපාහ, මේජර් එම්සී ප්‍රසාද් ශ්‍රීලපාහ, කපිතන් එච්එස්එම් නිරෝෂණ ශ්‍රීලපාහ, කපිතන් ඩීඩීපී නිශ්ශංක ශ්‍රීලපාහ, කපිතන් ඒපීයූඑස් අධිකාරි ශ්‍රීලපාහ, කපිතන් එම්එල්එස් මද්දුමගේ ශ්‍රීලපාහ, කපිතන් එම්ඩීඑම් කුමාර ශ්‍රීලපාහ යන නිලධාරීන් අණ හා මාණ්ඩලික විද්‍යාලයට අතුළත්වීමේ ලිඛිත පරීක්ෂණය සමත් වී අණ හා මාණ්ඩලික පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසුකම් ලබා ඇති බැව් සතුටින් දන්වා සිටිමු. තවද, අණ හා මාණ්ඩලික පාඨමාලාව හැදෑරීමට තේරී පත්වූ නිලධාරීන් හට එම පාඨමාලාව සාර්ථකව හදාරා ඉහළ සාමාර්ථ ලබාගැනීමට අවැසි ශක්තිය ධෛර්යය ලැබේවායි රෙජි අධිපති තුමන් ප්‍රමුඛ සියලුම නිලයින් විසින් මෙසේ සුභාශිංසන පිරිනමන්නෙමු.


නි/66312 මේජර් එස්එන් හල්වතුර ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී, ආර්එස්පී ශ්‍රීලපාහ


නි/66505 මේජර් ඒඑම්එල්කේ ගුණතිලක ආර්එස්පී ශ්‍රීලපාහ


නි/6200 මේජර් කේබී කුළතුංග ආර්එස්පී ශ්‍රීලපාහ


නි/6144 මේජර් එම්සී ප්‍රසාද් ශ්‍රීලපාහ,


නි/67973 කපිතන් එච්එස්එම් නිරෝෂණ ශ්‍රීලපාහ,


නි/68144 කපිතන් ඩීඩීපී නිශ්ශංක ශ්‍රීලපාහ


නි/68253 කපිතන් ඒපීයූඑස් අධිකාරි ශ්‍රීලපාහ,


නි/68807 කපිතන් එම්එල්එස් මද්දුමගේ ශ්‍රීලපාහ,


නි/68810 කපිතන් එම්ඩීඑම් කුමාර ශ්‍රීලපාහ

# 'TIME MAY DESIDE THE FORTUNE OR MISFORTUNE'

By Maj IR Hewapathirana RSP psc SLLI

## Great Story

One of a great Major General once said a story that may assist to think about stability whilst mitigating challenges.

"There was a rural village consisted with third generation houses where inhabitants had considered horse as the main economy.

One of a poor family along with father, mother and, a young boy had a house that had gone out from the village. Despite, people had insisted that poor family was very unlucky because of losing the house, but father at the family replayed the unknown mystery due to running away the horse.

Secondly, horse had returned with more horses that indicated destiny. Village people again had pleasured the poor family saying fortune.

Thirdly, young boy of the concerned poor house had fallen down from the house resulting to break his one of a leg. People again considered it was as misfortune.

Apparently, war started in the country and all of young boys had been taken to war ending them to sacrifice life. Finally, the boy who was fallen down from the horse had saved life. Accordingly , time may decide next.

# වෛද්‍යාධාර පිරිනැමීම

## ශ්‍රීලපාහ සේවා වනිතා ශාඛාව විසිනි

ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිණිය ධනංජනී කරුණාසේකර මැතිණිය විසින් 2017.07.27 වන දින ශ්‍රීලපාහ රෙපිමේන්තු මධ්‍යස්ථානයේ දී 4 ශ්‍රීලපාහ ඒකකයට අයත් සෙ/325653 කෝප්‍රල් යාපා වයිඑම්එන්සී කොනොනිගේ දියණියන් දෙදෙනාට වැළඳී ඇති තැලිසීමියා රෝගයට වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම සඳහා රු.50,000/= ක වටිනාකමකින් යුත් ප්‍රේෂණ පතක් සහ 8 ශ්‍රීලපාහ ඒකකයට අයත් සෙ/305036 සාසෙ නිමල් බණ්ඩාර ඒච්ච්එම් යන සෙනීගේ හෘද්‍යාබාධ තත්වයෙන් පෙළෙන දියණියට වෛද්‍ය ප්‍රතිකාර ලබාගැනීම සඳහා රු. 30,000/= ක වටිනාකමකින් යුත් ප්‍රේෂණ පතක්ද පරිත්‍යාග කරන ලදී.



කෝප්‍රල් යාපා වයිඑම්එන්සී



සාසෙ නිමල් බණ්ඩාර ඒච්ච්එම්

# ක්‍රීඩා කටයුතු සඳහා ආධාර

ශ්‍රී ලංකා පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිතුමිය විසින් 2017.08.22 වන දින ශ්‍රීලපාහ රෙපිමේන්තු මධ්‍යස්ථානයේදී රෙම ශ්‍රීලපාහට අයත් නි/4121 ලුතිතන් කර්නල් ඩබ්ඒවයිකේ වීරසිංහ ශ්‍රීලපාහ නිලධාරිගේ පුතණුවන් වන ලකිඳු වීරසිංහ හට 2017.09.08 දින සිට 2017.09.12 දින දක්වා පැවැත්වීමට නියමිත ආසියානු ජල ක්‍රීඩා තරඟයට සහභාගී වීම සඳහා උස්බෙකිස්ථානය වෙත යාම සඳහා රු. 100,000/= ක වටිනාකමකින් යුත් ප්‍රේෂණ පතක් පරිත්‍යාග කරන ලදී.



# ශ්‍රීලපාහ ක්‍රීඩකයින් දැක්වූ ක්‍රීඩා දක්ෂතා සහ ජයග්‍රහණ

ශ්‍රීලපාහ ක්‍රීඩා අංශය විසිනි


ලාකෝ චතුරංග එච්එම්ඩබ්අයි අන්තර් රෙජිමේන්තු ස්කොෂ් තරගාවලියෙහි කේවල අනු ශූරතාවය

යුද්ධ හමුදාවේ ආරම්භයේදී ක්‍රීඩා කෙෂ්ත්‍රය තුල ජයකෙහෙලි නංවා ජාතික/ජාත්‍යන්තර ජයග්‍රහනයන් ලබාගනිමින් ක්‍රීඩාවෙන් මුදුන්පෙත්තට නැග සිට විශාල කීර්තියකට හිමිකම් කියු අප රෙජිමේන්තුව දශක තුනක් පුරාවට පැවති බෙදුම්වාදි ත්‍රස්තවාදය නිමාකිරීමට ඉදුරාම දායකත්වයක් ලබාදුන් රෙජිමේන්තුවක් වශයෙන් ක්‍රීඩාවෙන් මද විරාමයකට ලක්ව සිට නැවත ක්‍රීඩා ජයග්‍රහනයන් කරා ක්‍රමයෙන් අවතීර්ණව සිටී.

රටේ සාමකාමී වාතාවරණය ආරම්භයත් සමඟම යුද්ධ හමුදාව තුල ක්‍රීඩා කෙෂ්ත්‍රයේ විශාල පිබිදීමක් ඇති වු අතර, නව පන්නරයකින් යුද්ධ හමුදාව තුල ක්‍රීඩා තරඟාවලියන්හි දී කැපීපෙනෙන තරඟකාරිත්වයක් සෑම රෙජිමේන්තුවක් වෙතින්ම පෙන්නුම් කිරීම සුවිශේෂි වු කරුණකි. මෙහිදී අප රෙජිමේන්තුව වෙතින් ගිලිහී ගිය ජයග්‍රහණයන් නැවත ලබාගැනීම සඳහා විවිධ ක්‍රමවේද රාශියක් ක්‍රියාවට නංවන ලද අතර, ඒ අනුව ශ්‍රීලපාහ ක්‍රීඩා පාලක මණ්ඩලයක් යටතේ ක්‍රීඩා කමිටු පත් කරන ලදී.

එහිදී පත්කරන ලද ක්‍රීඩා කමිටු විසින් තමන් වෙත පවරන ලද ක්‍රීඩා සංචිතයන්හී උන්නතිය සඳහා ක්‍රීඩා පාලක මණ්ඩල උපදෙස් මත විවිධ ක්‍රමෝපායන් ක්‍රියාවට නංවමින් දිවයිනේ දක්ෂ ක්‍රීඩකයින් ඉඳුරාම සංචිත වෙත බඳවා ගැනීම හා ශ්‍රීලපාහ අන්තර් ඒකක ක්‍රීඩා තරඟාවලියන් හා වැඩමුළු පවත්වා දක්ෂ ක්‍රීඩකයින් සංචිත වෙත එක් කර සංචිත ශක්තිමත් කරන ලදී. ඒ අනුව මෙම කාලය තුල පහත දක්වා ඇති සුවිශේෂී වූ ජයග්‍රහණයන් ලබා රෙජිමේන්තුව වෙත විශාල කීර්තියක් එක්කර දීමට සමත්ව ඇත.


යුධ හමුදා අන්තර් රෙජිමේන්තු බැඩ්මින්ටන් තරඟාවලියෙහි කණ්ඩායම් අනුශූරතාවය, යුධ හමුදා අන්තර් රෙජිමේන්තු ස්වේච්ඡා බළසේනා වොලිබෝල් තරඟාවලියෙහි ශූරතාවය, යුධ හමුදා අන්තර් රෙජිමේන්තු රගර් තරඟාවලියෙහි බඳුන ශූරතාවය හිමිකර ගැනීම මෙන්ම, සෙ/326964 ලාකෝ රූපසිංහ එස්පීඒපී විසින් යුධ හමුදා අන්තර් රෙජිමේන්තු ආධුනික ස්කොෂ් තරඟාවලියෙහි කේවල ශූරතාවය හිමි කර ගැනීම, සෙ/21ඩී00453 ලාකෝ චතුරංග එච්එම්ඩබ්අයි විසින් යුධ හමුදා අන්තර් රෙජිමේන්තු ස්කොෂ් තරඟාවලියෙහි කේවල අනු ශූරතාවය, සෙ/320892 කෝප්‍රල් ප්‍රභාත් කේපී (ආර්එස්පී) විසින් යුධ හමුදා අන්තර් රෙජිමේන්තු ස්කොෂ් තරඟාවලියෙහි කේවල තෙවන ස්ථානය දිනාගැනීම සුවිශේෂී වූවකි.


ලාකෝ රූපසිංහ එස්පීඒපී ආධුනික ස්කොෂ් කේවල ශූරතාවය


කෝප්‍රල් ප්‍රභාත් කේපී (ආර්එස්පී) අන්තර් රෙජිමේන්තු ස්කොෂ් තරඟාවලියෙහි කේවල අනු ශූරතාවය

# විද්වත් උධෘතයකට හරවත් ටීකාවක්






**ලුතිතන් කර්නල් මංජුල චන්ද්‍රසේකර විසිනි**

විසිවැක්වන සියවසේ ප්‍රාඥයකු ලෙස සැලකෙන ආචාර්ය අබ්දුල් කලාම් විසින් ඉදිරිපත් කරන ලද මෙම කියමන අප සියළු දෙනාටම ජීවිතයේ දී අතිශය වැදගත් වේ. ආචාර්ය අබ්දුල් කලාම් යනු 1931 ඔක්තෝබර් මස 15 වන දින ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්තයේ රාමේෂ්වරන් වල උපත ලද ඉන්දියාවේ බිහි වූ එකොලොස් වන ජනපති වරයා වේ. ඔහු ලෝකප්‍රකට විද්‍යාඥයෙකු සහ අභ්‍යාවකාශ ඉංජිනේරුවරයෙකු ලෙස ප්‍රකට විය. ඔහුගේ ජනපති ධූර කාලය වූ 2002 සිට 2007 දක්වා වූ කාලය තුල ඔහු ජනතාවගේ ජනාධිපති (Peoples' President ) ලෙස හඳුන්වන ලදී. එමෙන්ම ඔහු ඉන්දියාවේ රොකට් තාක්ෂණය දියුණු කිරීමෙහිලා කළ උදාරතර සේවය නිසාම ඔහු ඉන්දියාවේ මිසයිල මිනිසා ලෙස හඳුන්වන ලදී. ඔහුගේ මෙම අති විශේෂ හැකියාවන් ඇගයීමකට ලක්කරමින් ලෝකයේ විශ්ව විද්‍යාල 30 කට වැඩි ප්‍රමාණයකින් ගෞරව ආචාර්ය උපාධිය පිරිනමා ඇත.

"All birds find shelter during a rain. But Eagle avoids rain by flying above Clouds. Problems are common, but attitude makes the difference" "සියළු පක්ෂීහු වැස්සකදී සෙවිලි සොයති නමුත් රාජාලියා වැහි වළාකළු උඩින් පියාසර කරමින් නොතෙමී සිටී. එබැවින් ප්‍රශ්න සියළු දෙනාටම පොදුවන නමුත්, ආකල්ප තුලින් ප්‍රශ්න වෙනස්කර ගත හැකිය.

– Dr. APJ Abdul Kalam-
-ආචාර්ය අබ්දුල් කලාම්-

ඔහු විසින් රචිත "Wings of Fire" (An Autobiography of APJ Abdul Kalam), "India 2020 – A Vision for the New Millennium", "My journey" and "Ignited Minds Unleashing the power within India" වැනි පොත්පත් ඉතා අගනා කෘතීන් ලෙස සලකනු ලබන අතර, ඔහු ගේ හරවත් දේශණ, ලිපි සහ ඔහුටම ආවේනික වූ අදහස් මගින් ඉන්දියාවේ තරුණ පරපුර නව මගකට යොමු කළේය. ඔහුගේ විද්වත් උපුටනයන් (කියමන්) ලොව වටා අද ද ජනප්‍රියව පවති. 1974 දී සිදුකල ඉන්දියානු පළමු න්‍යෂ්ඨික අත්හදා බැලීමේ සිට 1998 තෙක් සිදුකල Agni, Prithivi Pokhran-II fmdlardka II න්‍යෂ්ඨික අත්හදා බැලීම තෙක් ඔහු එම කාර්යය සඳහා තාක්ෂණික සහ දේශපාලනික මඟපෙන්වන්නකු ලෙස කටයුතු කර ඇත.

ඔහු විසින් ඉදිරිපත් කරන ලද ඉහත කියමන (Positive Attitude) ධනාත්මක ආකල්ප ඇතිකර ගැනීම සම්බන්ධව පුළුල් මඟපෙන්වීමක් කරනු ලබයි. අප සියළු දෙනාටත් අසීමාන්තික දක්ෂතාවයන්, හැකියාවන්, නිපුණතාවයන් සහ අවස්ථා ලැබුණ ද එයින් සාර්ථක ප්‍රයෝජන ගනු ලබන්නේ අතලොස්සක් පමණි. ඒ අනුව ජීවිතයේ සාර්ථකත්වය රඳා පවතිනු ලබන ප්‍රධාන කරුණු තුනක් ගෙනහැර දැක්විය හැකිය. එනම්. දැණුම (Knowledge), නිපුණතාවයන් (Skills), ආකල්ප (Attitude) ලෙස හැඳින්විය හැකිය.

මින් ශාරීරික සහ මානසික පුහුණුව තුලින් සෑම කෙනෙකුටම අප වෙතින් නිතර ප්‍රදර්ශනය වන දැණුම සහ කුසලතාවයන් වර්ධනය කරගත හැකි වුවද ආකල්ප වර්ධනය කර ගැනීම අප විසින්ම කල යුතු සැමට නොපෙනෙන කාර්යයක්ම වන්නේය. ආකල්ප යනු අප ලෝකය දෙස බලන ආකාරයයි. අප යමක් දෙස බැලීමේදී එය ධනාත්මකව හෝ නිශේධනාත්මකව බලා ඒ පිළිබඳ අර්ථ සිතිවිලි නංවයි. එම සිතිවිලි වලට අනුව අප ජීවත්වන පරිසරය නිර්මාණය වනු ඇත. (Positive Attitude) ධනාත්මක ආකල්ප ඇති පුද්ගලයින් තමන්ගේ ප්‍රශ්න ඔවුන්ටම ආවේණික ක්‍රමවේදයන් වලට අනුව නිරාකරණය කර ගනිමින් ජීවිතයේ සාර්ථකත්වය ලඟාකර ගනු ලබයි. අපගේ නිවෙස්, පාසල්, මිතුරන්, රාජකාරි පරිසරය, මාධ්‍ය, සංස්කෘතිය, ආගම, සමාජීය හා දේශපාලන පරිසරය වැනි සාධක තුල අපගේ ආකල්ප නිර්මාණය වේ. එම කරුණු හේතුවෙන් අප තුල නිර්මාණය වී ඇති ආකල්ප නිශේධනාත්මක වී ඇත්නම් අප විසින් අපගේ දැනුම, ප්‍රඥාව සහ අත්දැකීම් වර්ධනය කර ගනිමින් එකී ආකල්ප ධනාත්මක ලෙස දියුණු කර ගත යුතුය.

ඇමරිකානු ජාතික මනෝ වෛද්‍ය විශේෂඥයෙකු වූ විලියම්ස් ජේම්ස්ට අනුව ද නව පරම්පරාවේ මහ සොයා ගැනීම යනු මනුෂ්‍යයින්ට තම ජීවිතය යහපත් ආකල්ප තුලින් වෙනස්කර ගත හැකි බවයි. ඒ අනුව ජීවිතයේ සාර්ථකත්වය ලඟා කර ගැනීමට අපට ලබාගත හැකි අවස්ථාවන් දෙස බැලීමේදී දොරක් අඩවන් වී ඇති විට එය බාගෙට වැසී ඇති දොරක් ලෙස නොසිතා එය බාගෙට විවර වී ඇති දොරක් ලෙස සිතිය යුතුය. සෑම දෙයක් පිළිබඳවම සර්ව සුභවාදී ලෙස බැලීමෙන් රාජකාරී කිරීමේදී අප වෙත ළඟාවන ආතතිය අවමකර ගනිමින් ජීවිතය ජය ගැනීමට හැකි බව මෙම මහා ප්‍රාඥයාගේ කියමන අනුව සනාථ වේ.

# 1 ශ්‍රීලපාහ බළඇණි පුහුණුවීම්



අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ආර්ඒ සමරනායක යුඑස්පී පීඑස්සී ශ්‍රීලපාහ ගේ පූර්ණ අධීක්ෂණය යටතේ මුතියන්කට්ටුකුලම් 64 සේමු බළඇණි පුහුණු පාසලේ 2017.04.25 වන දින බළඇණි පුහුණුව ආරම්භ වු අතර, ඒ සඳහා නිලධාරින් 09 දෙනෙකු සහ සෙසුනිලයින් 229 සහභාගී විය. ආරම්භක දේශණය 592 බළසේනාධිපති බ්‍රිගේඩියර් ඩබ්එම්පීසීඑස්බී විජේසුන්දර ආර්එස්පී යුඑස්පී යන ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් විසින් සිදු කරන ලදී. ප්‍රදේශයේ පැවති අධික උෂ්ණත්ව තත්වයන් යටතේ සියලු අභියෝග ජයගනිමින් බළඇණියේ නිලධාරින් සහ සියලුම සෙනින් එකමුතුව සහ ධෛර්‍යයෙන් පුහුණුවීම් වල නිරතවුහ. මෙහිදී ශාරීරික අභ්‍යාස, යුධ බාධක තරණය, යුධ උපක්‍රම, අවි පුහුණුව, පීව වෙඩි තැබීම්, සිතියම් කියවීම, නගරබද සටන්, වෙහෙසකර පා ගමන්, රැකසිට පහරදිම්, වනයේ ලැගුම් ගැනීම් ආදී විවිධ දේශණ තුලින් ලද දැනුම හා ප්‍රායෝගික පුහුණුව තුලින් නායකත්ව ගුණාංග වර්ධනය කර ගන්නා ලදී.

මෙවර බළඇණියේ කණ්ඩායම් ශූරතාවය දිනා ගැනීමට "සී" කණ්ඩායම සමත් වු අතර, සෑම අතින්ම අතිශූර ශිෂ්‍යයාට හිමි කුසලානය සහ දක්‍ෂතම නිලධාරි අණදෙන හට හිමි කුසලානය "සී" කණ්ඩායමේ ලුතිතන් පිඑච්එස් චින්තක ශ්‍රීලපාහ යන නිලධාරි අණදෙන විසින් හිමිකර ගත් අතර, දක්ෂතම වෙඩික්කරු කුසලානය





එම කණ්ඩායමේ සෙ/327120 ලාකෝ සංජීව එච්කේබී හට ද, හොඳම ශාරීරික යෝග්‍යතාවයෙන් පිරිපුන් ශිෂ්‍යයාට හිමි සම්මානය ආධාරක කණ්ඩායමේ සෙ/329314 ලාකෝ හේරත් එච්එම්එස් විසින් හිමිකර ගන්නා ලදී.

බළඇණි සාමූහික පුහුණුවීම් පාඨමාලාව පුරා මාස දෙකකට ආසන්න කාලයක් පැවති අතර, 2017.06.20 වන දින පහුණුවීම් කටයුතු සාර්ථකව නිම කිරීමෙන් පසු අවසන් දේශනය 592 බළසේනාධිපති බ්‍රිගේඩියර් ඩබ්එම්පීසීඑස්බී විජේසුන්දර ආර්එස්පී යුඑස්පී විසින් සිදු කරන ලදී. 2017.07.07 වන දින අධාරක කණ්ඩායමේ පීව වෙඩි තැබීම කල්පිටිය ගුවන් හමුදා ක්ෂේත්‍ර වෙඩි පිටියේදී සිදු කරන ලදී. ඒ සඳහා නිලධාරි 01 සහ සෙසුනිලයින් 30 දෙනකු සහභාගී විය.



කණ්ඩායම් ශූරතාවය දිනාගත් "සී" කණ්ඩායම



සෑම අතින්ම අතිශූර ශිෂ්‍යයා සහ
දක්ෂතම නිලධාරී අණදෙන
ලුතිතන් පීඑච්එස් චින්තක ශ්‍රීලපාහ



හොඳම ශාරීරික යෝග්‍යතාවය ශිෂ්‍යයා
ලාකෝ හේරත් එච්එම්එස්



දක්ෂතම වෙඩික්කරු
ලාකෝ සංජිව එච්කේබී

# 53 සේමු අභියෝගතා කුසලාන ක්‍රීඩා තරඟාවලියේ අනුශූරතාවය ලැබූ 4 ශ්‍රීලපාහ



53 වන සේනාංකයට අයත් බළසේනා මූලස්ථාන සහ ඒකකයන් අතර වාර්ෂිකව පවත්වනු ලබන 53 වන සේනාංක අභියෝගතා කුසලාන ක්‍රීඩා තරඟාවලිය මෙම වසරේදී ද ඉතා උත්කර්ෂවත් අන්දමින් සංවිධානය කර තිබූ අතර, එයට සමගාමීව ක්‍රිකට් තරඟාවලියක් සහ පාපන්දු තරඟාවලියක් මෙන්ම අත්පන්දු තරඟාවලියක් ද සංවිධානය කර තිබිණ.

2017.07.21, 22 සහ 23 දින දක්වා වැහැර ක්‍රීඩාංගණයේදී පාපන්දු තරඟාවලිය පැවැත්වූ අතර, ඒ සඳහා කණ්ඩායම් 14 ක් සහභාගී විය. එම කණ්ඩායම් සමඟ අප ඒකක කණ්ඩායම උරෙන් උර ගැටී තරඟ වැද 533 බළසේනා මූලස්ථාන කණ්ඩායම සමඟ අවසන් මහා තරඟය සඳහා තේරී පත්වූ අතර, අවසන් මහා තරඟයේදී අප ඒකක කණ්ඩායම ප්‍රතිවාදී කණ්ඩායම සමඟ තරඟ වැද ගෝල 9/0 ක් වශයෙන් ලබාගෙන 53 සේමු පාපන්දු ශූරයෝ වූයෙමු. මෙම අවසන් මහා තරඟයේ දක්ෂතම ක්‍රීඩකයාට හිමි සම්මානය මෙන්ම සමස්ථ තරඟාවලියේ දක්ෂතම ගෝල රැස් කරන්නාට හිමි සම්මානය සෙ/312909 ලාකෝ අනුරාධ ජීඩබ්බී සහ අවසන් තරඟයේ දක්ෂතම දැල් රකින්නාට හිමි සම්මානය සෙ/326728 ලාකෝ දිලංජන ඩබ්එම්එල් කොනොනින් විසින් හිමි කර ගන්නා ලදී.

එයට සමගාමීව මිහින්තලය රන්මිණි ක්‍රීඩාංගණයේදී පැවැති ක්‍රිකට් තරඟාවලිය සඳහා කපිතන් එන්ඩීපී වික්‍රමසිංහ ශ්‍රීලපාහ ගේ නායකත්වය මත සහභාගී වූ අප ඒකක කණ්ඩායම 20 වන ගජබා



53 වන සේනාංකාධිපති තුමන් සුරතින් කපිතන් එන්ඩීපී වික්‍රමසිංහ ශ්‍රීලපාහ විසින් ක්‍රිකට් අනුශූරතාවයට හිමි කුසලානය ලබාගැනීම

රෙජිමේන්තු කණ්ඩායම සමඟ අවසන් මහා තරඟය සඳහා සුදුසුකම් ලබා ගන්නා ලදී. ඒ අනුව අවසන් මහා තරඟය 20 වන ගජබා රෙජිමේන්තු කණ්ඩායම සමඟ මිහින්තලය රජරට විශ්ව විද්‍යාල ක්‍රීඩාංගණයේදී 2017.07.31 වන දින පැවැත්වූ අතර, එම තරඟයේදී 4 ශ්‍රීලපාහ කණ්ඩායම අනුශූරතාවය හිමි කරගන්නා ලදී.

2017.07.27, 28 සහ 29 යන දිනයන් තුළදී දියතලාව 1 වන ගැමුණු හේවා බළඇණි ක්‍රීඩාංගණයේදී අත්පන්දු තරඟාවලිය පැවැත්වූ අතර, අප කණ්ඩායම හා 8 විපාරෙ අත්පන්දු කණ්ඩායම අවසන් මහා තරඟය සඳහා සුදුසුකම් ලබා ගන්නා ලදී. අවසන් මහා තරඟය 2017.08.08 වන දින 53 සේමු ක්‍රීඩාංගණයේදී පැවැත්වූ අතර, මෙම තරඟයේදී ප්‍රතිවාදි කණ්ඩායම සමග තරඟ වැද 4 ශ්‍රීලපාහ කණ්ඩායම අනුශූරතාවය දිනාගන්නා ලදී.

ඉන් අනතුරුව 53 වන සේනාංකාධිපති මේජර් ජෙනරල් ආර්ඩබ්ලිව්ඩබ්ලිව්ඒඩීබී රාජගුරු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන්ගේ සුරතින් ජයග්‍රාහී සියලු දෙනා හට කුසලානයන් පිරිනමන ලදී. එළඹෙන ඉදිරි ක්‍රීඩා ඉසව් ජයගෙන 4 ශ්‍රීලපාහ ඒකකය මෙන්ම ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුව ද බැබළවීමට තව තවත් ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරන්නෙමු.








53 වන සේනාංකාධිපතිතුමාගේ සුරතින්
පාපන්දු අනුශූරතාවයට හිමි කුසලානය ලබාගනිමින්

# ප්‍රතිත්‍රස්ත යුද උපක්‍රම පාඨමාලාවේ නිලධාරීන්ගේ 7 ශ්‍රීලපාහ කඳවුරු සංචාරය



යුද හමුදා පුහුණු පාසල මාදුරුඔය හි පැවැති නිලධාරි ප්‍රතිත්‍රස්ථ යුද උපක්‍රම පාඨමාලා අංක 19 හදාරනු ලැබූ දේශීය හා විදේශීය නිලධාරීන් ආරක්ෂක සේනා මුලස්ථානය කිලිනොච්චි බළප්‍රදේශයේ පැවති මානුෂීය ක්‍රියාන්විත පිළිබඳව තොරතුරු ගවේෂණය කිරීමේ ක්ෂේත්‍ර චාරිකාවක නිරත විය. මෙහිදී ආසේමු (කිළි) යටතේ ඇති අප බළඇණිය මෙම අධ්‍යයන චාරිකාව සඳහා තෝරාගත් අතර, එම ශිෂ්‍ය නිලධාරින් 2017. 07 18 වන දින 7 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාව වෙත ද, පැමිණි අතර, එම නිලධාරින් ඒකකයේ වත්මන් අණදෙන නිලධාරි මේජර් එම්ටීඅයි ගුණවර්ධන ආර්එස්පී පීඑස්සී ශ්‍රීලපාහ විසින් මහත් හරසරින් පිලිගන්නා ලදී.



අනතුරුව එම නිලධාරින් හට වසර 30 ක පැවැති යුද්ධ නිමාවෙන් පසු යුද්ධ හමුදා භට පිරිස් විසින් දැනට කිලිනොච්චි ප්‍රදේශයේ සිවිල් වැසියනගේ ජන ජීවිතය නංවාලීම සඳහා සිදුකරනු ලබන කාර්යභාරය පිලිබඳව අණදෙන නිලධාරි තුමා විසින් සාර්ථක ඉදිරිපත් කිරීමක් සිදුකරන ලදී. පසුව නිලධාරි නිවස්නයේ සුදානම් කර තිබූ ප්‍රණීත දිවා ආහාරය ලබා ගැනීමෙන් අනතුරුව එම ශිෂ්‍ය නිලධාරින් බළඇණියේ රාජකාරි කටයුතු සිදුකරනු ලබන ආකාරය ඇගයීමකට ලක් කරමින් කඳවුරෙන් නික්ම යන ලදී.



# පුළුල් සිනමා දර්ශණ තිරය සහ ආපන ශාලාව විවෘත කිරීම




ඒකකයේ නිලධාරීන් සහ සෙසුනිලයින් මානසික ඒකාකාරීභාවයෙන් මුදවා සෙබලුන්ගේ මානසිකත්වය ඉහළ මට්ටමකට ගෙන ඒමේ අරමුණ පෙරදැරිව අණදෙන නිලධාරී මේජර් එම්ටීඅයි ගුණවර්ධන ආර්එස්පී පීඑස්සී ගේ පූර්ණ අධීක්ෂණය හා මඟ පෙන්වීම මත ඒකකයේ සියලුම නිලයින්ගේ සහයෝගය ඇතිව සිනමා ප්‍රදර්ශනය කිරීම සඳහා පුළුල් තිරයක් සහ ආපන ශාලාවක් කඳවුරු භූමියේ ස්ථාපිත කරන ලදී

නවතමයෙන් ඉදිකරන ලද මෙම පුළුල් තිරය සහ ආපන ශාලාව 2017.07.12 වන දින සන්ධ්‍යා භාගයේ අණදෙන නිලධාරී තුමන්ගේ සුරතින් විවෘත වු අතර, එදින රාත්‍රියේ ඒකකයේ සියලුම නිලධාරීන් සහ සෙසුනිලයින් හට "සෙවන් බීට් " සංගීත කණ්ඩායම සමඟ මියුරු සංගීත සැඳෑවක් හා අණදෙන නිලධාරී තුමන්ගේ උපදෙස් පරිදි ආපන ශාලාව තුලින් නොමිලේ ආහාර වේලක් භුක්ති විඳීමට අවස්ථාවක් ලබාදෙන ලදී.

ඒකකයේ රාජකාරී කරනු ලබන නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ උන්නතිය උදෙසා කරන්නා වු මෙම කැපකිරීම සඳහා අණදෙන නිලධාරී තුමන් වෙත ඒකකයේ සියලුම නිලයින්ගේ හදපිරී කෘතඥතාවය මෙසේ පිරිනමන්නෙමු.





# දහතුන් වන සංවත්සරය සැමරූ 8 ශ්‍රීලපාහ



2004.03.25 වන දින ස්වාධීන ඒකකයක් ලෙස ස්ථාපිත කරන ලද 8 ශ්‍රීලපාහ ඒකකය තම 13 වන බළඇණි සංවත්සරය 2017.03.25 වන දින මහත් අභිමානයෙන් යුතුව සමරන ලදී. දැනට ඒකකය ගම්පහ දිස්ත්‍රික්කයේ ඇති ප්‍රධානතම මරමස්ථාන ආවරණය වන පරිදි ආරක්ෂාව සපයමින් දෙල්ගොඩ ප්‍රදේශයේ බළඇණි මුලස්ථානය ස්ථානගතව රාජකාරි කරනු ලබයි.

බළඇණි දිනයට සමගාමීව අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එල්එච්සීආර් සිරිවර්ධන ආර්එස්පී ශ්‍රීලපාහ යන ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමා වෙත කඳවුරු මුරයක් ලබාදීමෙන් පසු ඒකක නිලධාරින් සහ සෙසුනිලයින් විසින් සම්මාන පෙළපාලියක් පිරිනමන ලද අතර, සියලු නිලයින් ඇමතූ අණදෙන නිලධාරි තුමා, මනා පුහුණුව හා විනය ගරුක සෙබලුන් පිරිසක් තෑලින් ලබාගත් විජයග්‍රහණයන් සමඟින් යුද්ධ හමුදාවේ කීර්තියත් ඒකකයේ අභිවෘද්ධියත් උදෙසා සියලු දෙනා ඇපකැපවී ඉදිරියටත් තම වැඩකටයුතු නොපිරිහෙලා ඉටුකරමින් අප බළඇණිය ඉදිරි වර්ෂයේදී ශ්‍රීලපාහ ඒකක අතුරින් හොඳම බළඇණිය බවට පත්කර ගැනීමට සියලු දෙනා අදිටන් කර ගන්නා ලෙස අවධාරනය කර අනතුරුව සියලුම නිලයින් සඳහා පවත්වන ලද දිවා භෝජන සංග්‍රහයට සහභාගී විය.



# ගංවතුරෙන් අවතැන්වූ ගම්පහ දිස්ත්‍රික්කයේ සිවිල් ජනයා මුදවාගත් 8 ශ්‍රීලපාහ මෙහෙයුම



පසුගිය දිනවල දිවයිනේ පැවති අයහපත් කාලගුණික තත්වය මත කැලණි ගඟ පිටාර ගැලීම හේතුවෙන් ඒ ආශ්‍රිත දොම්පෙ, මල්වාන, බියගම, කැලණිය යන ප්‍රදේශවල ගංවතුරින් යටවූ අතර, එයින් විශාල පවුල් සංඛ්‍යාවක් අවතැන්විය. එහිදී 8 ශ්‍රීලපාහ ඒකකයේ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එල්එච්සීආර් සිරිවර්ධන ආර්එස්පී ශ්‍රීලපාහ විසින් හදිසි ඕනෑම ආපදා තත්වයකදී මුහණදීමට භට පිරිස් සුදානම් කරන ලදී.

ගංවතුරින් අවතැන්වූ සිවිල් ජනතාව මුදවා ගැනීම සඳහා ක්ෂණිකව ක්‍රියාත්මකවූ භට පිරිස් විසින් ප්‍රදේශයන්හි පවුල්වල වැසියන් මුදවා ගැනීමේ මෙහෙයුම්වල නිරතවිය. එහිදී අවතැන්වූ සහ පීඩාවට පත්වූ විශාල පිරිසක් මෙම උවදුරින් මුදවාගැනීමට 8 ශ්‍රීලපාහ භට පිරිස් සමත්වූ අතර, මුදවා ගත් හා අවතැන්වූ ජනතාව වෙත ආහාරපාන ආදිය ලබාදෙමින් සහන සැලසීම ද සිදුකරන ලදී.

# ඩෙංගු රෝගීන් සුවපත් කිරීමට උරදුන් 8 ශ්‍රීලපාහ






දිවයිනේ සීඝ්‍රයෙන් පැතිරගොස් ඇති ඩෙංගු මදුරු උවදුර හේතුවෙන් රෝගාතුරව රෝහල් ගතවූ රෝගීන් සංඛ්‍යාව විශාල ලෙස ඉහළ යාම හේතුවෙන් ගම්පහ දිස්ත්‍රීක්කයේ ස්ථාපිත සියලුම රෝහල් වල රෝගීන් සඳහා උවටැන් කිරීමට එම රෝහල් වල කාර්යමණ්ඩලය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ආසාධ්‍ය රෝගීන් මහත් අසීරුතාවයකට පත්විය.

එයට පිළියමක් ලෙස මෙම ඒකකය විසින් ගම්පහ දිස්ත්‍රීක් මහ රෝහල වෙත භට පිරිසක් දෛනිකව සහභාගී කරවන ලද අතර, එහිදී රෝහල් කාර්ය මණ්ඩලය සමඟ එක්ව රෝගීන් සඳහා උවටැන් කිරීමට සහය වෙමින් ප්‍රජා මෙහෙවරක නිරත විය. මෙම මහඟු කාර්යය අධීක්ෂණය කළ අණදෙන නිලධාරි තුමා සහ සහභාගීවූ භට පිරිස් වෙත රෙජිමේන්තු අධිපති තුමන් ප්‍රමුඛ සියලුම නිලයින්ගේ කෘතඥතාවය පුද කර සිටිමු.

# 9 (සෙව්) ශ්‍රීලපාහ ප්‍රථම විශ්‍රාමික සුහද හමුව



1993.11.01 වන දින පලාලි මයිලඩි ප්‍රදේශයේ ස්ථාපනය කළ 9 (සෙව්) ශ්‍රීලපාහ ඒකකය ඒකකයක් වශයෙන් නගාසිටුවීමේ ක්‍රියාවලියේදී මුලිකත්වය ගෙන ක්‍රියා කළ දැනට විශ්‍රාම සුවයෙන් කල් ගෙවන ජ්‍යෙෂ්ඨ නිලධාරීන්, නිලධාරීන් හා සියලුම සෙසුනිලයින් ද, ඒකකයට අණදුන් සියලුම අණදෙන නිලධාරීන් ද සහභාගී කරගනිමින් ඔවුන් විසින් ඒකකයට මෙන්ම සමස්ථ යුද හමුදාවට කළ සේවය ඇගයීමක් ලෙස අණදෙන නිලධාරී මේජර් ඒඩී ගුණරත්න ආර්එස්පී ශ්‍රීලපාහගේ සංකල්පයක් මල්ඵල ගන්වමින් 2017.08.05 වන දින පළමු වරට විශ්‍රාමික සුහද හමුවක් පවත්වන ලදී.

මෙම සුහද හමුව සඳහා පැමිණි සියලුම නිලයින් උණුසුම් ආකාරයෙන් පිළිගනිමින් අණදෙන නිලධාරී තුමන් විසින් උත්සවයේ අරමුණු පැහැදිළි කරමින් පිළිගැනිමේ කථාවක් සිදුකරන ලදී. එහි දී ශ්‍රී ලංයු සෙව්බමු හිටපු නියෝජ්‍ය සේනාවිධායක හා ඒකකයේ සිව්වන අණදෙන නිලධාරී මේජර් ජෙනරල් ඩබ්ඩීඑල්පී වික්‍රමසිංහ ආර්එස්පී කේඑස්වී (විශ්‍රාමික), ඒකකයේ ප්‍රථම අණදෙන නිලධාරී බ්‍රිගේඩියර් ජේබී ගල්ගමුව (විශ්‍රාමික), සිව්වන රෙසැමේ බනි 1 එපි ප්‍රේමදාස සභාවට තම අත්දැකීම් විස්තර කළ අතර, මෙවැනි හමුවක් සංවිධානය කිරීම පිළිබඳව අණදෙන නිලධාරී ප්‍රමුඛ ඒකකයේ සියලුම නිලයින් වෙත ඔවුන්ගේ කෘතවේදීත්වය පුදකර සිටියහ.

අනතුරුව ඔවුන් වෙනුවෙන් සූදානම් කර තිබූ තේ පැන් සංග්‍රහයෙන් පසු සුහද හමුවට පැමිණි සියලු දෙනාගේ රාසාස්වාදය සඳහා ඒකකයේ "සිල්වර් නයින්" සංගීත කණ්ඩායම සමඟින් සංගීතවත් වූ අතර, සූදානම් කර තිබූ දිවා භෝජන සංග්‍රහය බුක්ති විඳීමෙන් පසු ප්‍රථම සුහද හමුව සිහිවීම පිණිස අණදෙන නිලධාරී තුමා විසින් ඔවුන් සියලු දෙනා වෙත සමරු තිළිණ ලබාදෙන ලදී. මෙම උත්සවයේ සමාප්තිය සනිටුහන් කරමින් පැමිණි සියලු දෙනා ඒකකයට ස්තුතිය සහ ගෞරවය පුදකරමින් නික්ම යන ලදී.








SILVER
NINE









# විශේෂ පාබල ක්‍රියාන්විත පුහුණු පාඨමාලාවේ ජයග්‍රහණ හිමිකරගත් 10 ශ්‍රීලපාහ





පාඨමාලාවේ සෑම අතින්ම අතිශූර ශිෂ්‍යයා නි/69768 ලුතිතන් එච්එල්අයි කරුණාරත්න ශ්‍රීලපාහ

පුහුණුඅම වාර්ෂික පුහුණු සැලැස්මකට අනුව ආසේමු (කිළි) වෙතින් පවත්වනු ලැබූ විශේෂ පාබල ක්‍රියාන්විත පුහුණු පාඨමාලාව අංක 59 සඳහා මෙම ඒකක අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එම්ඩීඑස්එන් කරුණාරත්න පීඑස්සී ගේ පූර්ණ අධීක්ෂණය සහ මඟපෙන්වීම යටතේ පවත්වන ලදී.

මෙම පාඨමාලාව සඳහා එක් නිලධාරියෙකු සහ සෙසුනිලයින් 08 දෙනෙකුගෙන් සමන්විත වූ හඨ පිරිසක් සහභාගී කරවන ලද අතර, යුද හමුදා පාබල ඒකකයන් වෙතින් කණ්ඩායම් 24 ක් සහභාගී විය. අඩියර 06 කින් සමන්විත මෙම පාඨමාලාවෙහි කණ්ඩායම් දැනුම හා ප්‍රායෝගික පුහුණුව තුලින් සාමූහිකත්වය සහ තරඟකාරීත්වය වර්ධනය කරමින් කණ්ඩායම් 24 ක් අතුරින් අප ඒකක කණ්ඩායම හොඳම පෙල වශයෙන් ද, සෑම අතින්ම අතිශූර ශිෂ්‍යයා ලෙස නි/69768 ලුතිතන් එච්එල්අයි කරුණාරත්න ශ්‍රීලපාහ සුදුසුකම් ලැබීය.

විශේෂ පාබල කණ්ඩ පුහුණු පාඨමාලාව 2017 ජනවාරි මස 23 දින සිට ජූනි මස 09 වන දින දක්වා පැවැත්වූ අතර, මෙම ජයග්‍රහනය 10 ශ්‍රීලපාහ ඒකකයටත්, ශ්‍රීලංකා පාබල හමුදා රෙජිමේන්තුවටත් මහත් අභිමානයක් හා ගෞරවයක් ලබාදීමට සමත් විය.

# දුම්වැටියෙන් තොර නිදහස් කලාපයක් බවට පත්වෙමින් තිබෙන 12 ශ්‍රීලපාහ කඳවුරු පරිශ්‍රය




මුළුමහත් ශ්‍රී ලංකාවම ජාති ආගම් බේදයකින් තොරව ජීවිත බිළිගනිමින් සිටින දුම් වැටියෙන් නූතන පරම්පරාව මුදවා ගැනීමට ශ්‍රී ලංකා ජනරජය මෙන්ම යුද හමුදාව වෙතින් ද ඉමහත් වෙහෙසකර අපිරිමිත මෙහෙයුමක නිරත වෙමින් සිටියි.

ඒකක අණදෙන නිලධාරී ලුතිතන් කර්නල් එච්එච්එච්එස්පීඑස් ද සිල්වා ආර්එස්පී ශ්‍රීලපාහ ගේ පූර්ණ අධීක්ෂණය යටතේ 12 ශ්‍රීලපාහ වෙතින් ද ඒ පිළිබඳව විවිධ වැඩමුළු හා දේශන මෙන්ම දැන්වීම් ඒකකය තුළ දියත් කර ඇත.

ඒකකයේ අණ සහ පාලන කණ්ඩායමේ නිලධාරී අණ දෙන මේජර් ඒචල්කේ ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ශ්‍රීලපාහ ගේ අධීක්ෂණය යටතේ ඒකකය දුම්වැටියෙන් මුදවා ගැනීමේ පරමාර්ථය මුදුන්පත් කරගෙන ඒකකය තුළ නැවුම් පළතුරු බීම හලක් ඉතා උසස් අන්දමින් සහනදායි මිල ගණන් යටතේ පවත්වාගෙන යනු ලබයි. මෙමඟින් ඒකකයේ සුබසාධන කටයුතු සඳහා පිටුවහලක් ලැබෙන අතරම, සෙබළුන්ගේ සෞඛ්‍ය සම්පන්න බව රැකගැනීමට ද මහෝපකාරී වන බැව් නිසැකය.

# රෙජිමේන්තු එල්ලේ අනුශූරතාවය 12 ශ්‍රීලපාහ හිමි කරගනියි




12 ශ්‍රීලපාහ ඒකකය විසින් සංවිධානය කරනු ලැබූ අන්තර් ඒකක එල්ලේ තරඟාවලිය 2017.08.16 සහ 17 දිනයන් හි කැලණිතිස්ස සීවලී ක්‍රීඩාංගනයේ දී පැවැත් වූ අතර, අප ඒකකය මූලික වටයේ ප්‍රථම තරඟය 1 ශ්‍රීලපාහ ඒකකය සමඟින් පැවැත් වූ අතර, එම තරඟය ජයගැනීමත් සමඟ අර්ධ අවසන් පූර්ව වටයට පිවිසීම සඳහා 10 ශ්‍රීලපාහ ඒකකය සමඟින් පැවැති ඉතා තියුණු තරඟයකින් අනතුරුව අප ඒකකය ජයගන්නා ලදී.

අවසන් පූර්ව තරඟය සඳහා 9 (සෙව්) ශ්‍රීලපාහ ඒකකය සමඟින් තරඟයේදී එම කණ්ඩායම වෙතින් හිමි වූ ඉලක්කය ලකුණු 05ක් වූ අතර, එය පන්දු 8 පමණක් වැය කර ජයග්‍රහනය කිරීමට අප හට හැකි විය.

අපරාජිතව අවසන් මහා තරඟය දක්වා පැමිණි අප කණ්ඩායම 25 ශ්‍රීලපාහ කණ්ඩායම සමඟ 2017.08.17 දින ශ්‍රීලපාහ රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එම්එම් කිත්සිරි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ජ්‍යෙෂ්ඨ නිලධාරී තුමන්ගේ ප්‍රධානත්වයෙන් පවත්වනු ලැබූ අවසන් මහා තරඟයේදී ඉතා තියුණු අවස්ථාවකින් පසු අප ඒකකයට අනුශූරතාවය හිමිවිය.

# 14 (සෙව්) ශ්‍රීලපාහ ඒකකයේ නව සෙසුනිල භෝජනාගාරයට මුල්ගල තැබීම



14 (සෙව්) ශ්‍රීලපාහ ඒකකය මූලස්ථානය ඇතාවැටුනුවැව කඳවුරේ ස්ථානගතව ඇති අතර, මෙම ඒකකයේ තිබූ සෙසුනිල භෝජනාගාරයක ප්‍රධාන අඩුපාඩුව මඟහරවමින් අණදෙන නිලධාරි මේජර් සී ජයවීර ශ්‍රීලපාහ ගේ සංකල්පයකට අනුව 2017.08.24 වන දින අණදෙන නිලධාරි තුමන්ගේ ප්‍රධානත්වයෙන් නව සෙසුනිල භෝජනාගාරයක් ගොඩනැගීම සඳහා මුල්ගල තබන ලදී.

## ආසේමු (වන්නි) INNOVETA 2017 නව නිපැයුම් ප්‍රදර්ශණයේ ප්‍රථම ස්ථානය දිනූ 14 (සෙව්) ශ්‍රීලපාහ

56 වන සේනාංකය විසින් තෙවන වරට සංවිධානය කරන ලද ආසේමු (වන්නි) INNOVETA 2017 නව නිපැයුම් ප්‍රදර්ශණය 2017 සැප්තැම්බර් මස 23 හා 24 යන දෙදින තුල වව්නියාව පූන්තොට්ටම් උසස් අධ්‍යාපන විද්‍යාපීඨ පරිශ්‍රයේදී පවත්වන ලදී. ආසේමු (වන්නි) යටතේ පාලනය වන ඒකක 41 ක් නව නිපැයුම් ප්‍රදර්ශණය සඳහා නව නිර්මාණ ඉදිරිපත් කර තිබු අතර, 14 (සෙව්) ශ්‍රීලපාහ ඒකකය විසින් අර්ධ ස්වයංක්‍රීය කොකිස් නිපදවන යන්ත්‍රයක් ප්‍රදර්ශණයට ඉදිරිපත් කරන ලදී.

මෙම නිර්මාණය ප්‍රදර්ශණය නැරඹීමට පැමිණි සියලු දෙනාගේම ආකර්ශණය ලබාගැනීමට සමත් වු අතර, මේ සඳහා ඉවතලන යන්ත්‍ර කොටස් හා තහඩු භාවිතා කර තිබීම විනිශ්චය මණ්ඩලයේ විශේෂ අවධානය යොමුවීමට හේතු විය.

සෙ/14ඩී01097 ලාකෝ රත්නසිරි එම්පීපීකේ විසින් මෙම යන්ත්‍රය නිර්මාණය කළ අතර, ඒකක අණදෙන නිලධාරි තුමන් ඇතුලු සියලුම නිලයින්ගෙන් මනා සහයෝගයක් ඔහු වෙත ලබාදෙන ලදී. යාපනය විශ්ව විද්‍යාලයේ රසායනික විද්‍යා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පී අයින්කරන් මැතිතුමා හා කථිකාචාර්ය මේනකා සිවකරන් මැතිණිය ප්‍රමුඛ විනිසුරු මඩුල්ලක් නිර්මාණ තේරීම සඳහා සහභාගී විය. එහිදී නව නිර්මාණ 41 අතුරින් හොඳම නිර්මාණය ලෙස මෙම අර්ධ ස්වයංක්‍රීය කොකිස් නිපදවන යන්ත්‍රය තෝරා ගැණුනු අතර, එයට ප්‍රථම ස්ථානය හිමිවිය.



ස්වයංක්‍රීය කොකිස් නිපදවන යන්ත්‍රයේ නිර්මාතෘ
සෙ/14ඩී01097 ලාකෝ රත්නසිරි එම්පීපීකේ






# 15 ශ්‍රීලපාහ බළඇණි පුහුණුවීම්





2017.05.02 වන දින බළඇණි පුහුණුව සඳහා 22 වන සේනාංකය යටතේ පාලනය වන තාවුල්වැව බළඇණි පුහුණු පාසලේ පාඨමාලා අංක 22 යටතේ පුහුණුවීම් අරඹමින් ආරම්භක දේශණය 221 බළසේනාධිපති බ්‍රිගේඩියර් කේපීඑස් ප්‍රේමලාල් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී විසින් සිදුකරන ලද අතර, අප ඒකකයට එතුමා විසින් ලබා දෙනු ලැබූ අභියෝගය වූයේ බළඇණි පුහුණු පාසලේ එතෙක් පවතින ලද වැඩිම ලකුණු ප්‍රමාණය වන 70% ක ප්‍රමාණය ඉහළ නැංවීමට කටයුතු කරන ලෙස ය.

එම අභියෝගය භාරගත් 15 ශ්‍රීලපාහ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එච්කේජේයූ ජයරත්න ශ්‍රීලපාහ ඇතුළු භට පිරිස් පුහුණුවීම් අවසානයේ ඒකක ලකුණු ප්‍රමාණය 74 % ක් දක්වා ඉහළට රැගෙන එන ලද්දේ මෙතෙක් පුහුණු පාසලේ පැවති වාර්ථාවන් ද අභිබවමිනි. දක්ෂතම වෙඩික්කරුවාට හිමි වැඩිම ලකුණු ප්‍රමාණය සෙ/318937 කෝප්‍රල් දිසානායක ඩීඑම්එස්පී කොනොනි විසින් වාර්ථා කල අතර, අඩුම කාලයකින් බාධක තරණය කල සෙබලා හා හොඳම ශාරීරික යෝග්‍යතාවය හිමි සෙබලාගේ වාර්තාව අලුත් කිරීමට සෙ/322206 කෝප්‍රල් සමරසිංහ පීකේඑස්එන් යන කොනොනි හට හැකිවිය. ඒකකයේ දක්ෂතා පිළිබදව 22 වන සේනාංකාධිපති හා සියළුම බළසේනාධිපතිවරුන් ඇතුළු සියලූම ඒකකයන්හී පැසසුමට ලක්වූ අතර, 2017.06.02 වන දින බළඇණි පුහුණුවීම් නිමාවට පත්විය.



හොඳම ශාරීරික යෝග්‍යතාවය
සෙ/322206 කෝප්‍රල්
සමරසිංහ පීකේඑස්එන්



දක්ෂතම වෙඩික්කරු
සෙ/318937 කෝප්‍රල්
දිසානායක ඩීඑම්එස්පී

# යුධ හමුදාව බැබළවූ පාබල හමුදා ටයිකොන්ඩෝ ක්‍රීඩකයා



මෙම ඒකකයට අයත් රෙම ශ්‍රීලපාහ ටයිකොන්ඩෝ ක්‍රීඩා සංචිතයේ ක්‍රීඩා කරනු ලබන සෙ/328359 ලාකෝ ඒකනායක ඊඑම්එස් යන කොනොනි දක්ෂතා මතින් ඉදිරියට යන කැපී පෙනෙන ක්‍රීඩා තරුවකි. ඉදිරියේදී ද මෙවැනි ජයග්‍රහන ලබාගැනීමෙන් ඒකකයට හා රෙජිමේන්තුවට අභිමානයක් ගෙන ඒමට ශක්තිය හා ධෛර්යය ලැබේවායි ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති තුමන් ප්‍රමුඛ සියලුම නිලයින් මෙසේ ප්‍රාර්ථනා කරන්නෙමු.

## ඔහු විසින් දක්වන ලද දක්ෂතා

| | |
|---|---|
| 2013 අන්තර් රෙජිමේන්තු ආධුනික තරඟාවලිය | - රන් පදක්කම |
| 2014 වයඹ පලාත් ටයිකොන්ඩෝ තරඟාවලිය | - රන් පදක්කම |
| 2014 ජාතික මහා ක්‍රීඩා උළෙල | - රිදී පදක්කම |
| 2015 වයඹ පලාත් ටයිකොන්ඩෝ තරඟාවලිය | - රන් පදක්කම |
| 2015 කොරියානු කුසලාන ටයිකොන්ඩෝ තරඟාවලිය | - ලෝකඩ පදක්කම |
| 2015 කොරියානු කුසලාන ටයිකොන්ඩෝ ඇරබික් තරඟාවලිය | - රිදී පදක්කම |
| 2016 වයඹ පලාත් ටයිකොන්ඩෝ තරඟාවලිය | - රන් පදක්කම |
| 2017 වයඹ පලාත් ටයිකොන්ඩෝ තරඟාවලිය | - රන් පදක්කම |
| 2017 ටයිකොන්ඩෝ ජාතික මහා ක්‍රීඩා උළෙල | - රන් පදක්කම හා තරඟයේ දක්ෂතම ක්‍රීඩකයා |

# 15 ශ්‍රීලපාහ හඨ පිරිස්හි ශ්‍රම දායකත්වයෙන් ඉදිවන විරු සුමිතුරු නිවස





ආරක්ෂක අමාත්‍යාංශ "විරු සුමිතුරු" නිවාස ව්‍යාපෘතිය යටතේ 15 ශ්‍රීලපාහ ඒකකය රාජකාරි කරනු ලබන ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ මොල්ලිපොතාන ප්‍රදේශයේ පදිංචිව සිටින 5 (සෙවි) ශ්‍රීලපාහ ඒකකයට අයත් යුද්ධයේදී දිවිපිදූ සෙ/ඞී01124 සාසෙ ධර්මසේන කුරුවිට යන විරුවා වෙනුවෙන් ඔහුගේ බිරිඳ වන ඒපී ශ්‍රියානි යන අයට 15 ශ්‍රීලපාහ ඒකකයේ හඨපිරිස් වල ශ්‍රම දායකත්වයෙන් නව නිවසක් ඉදිකරමින් පවතී.

15 ශ්‍රීලපාහ ඒකකයේ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් එච්කේජේයූ ජයරත්න ශ්‍රීලපාහ ගේ පූර්ණ අධීක්ෂණය හා මඟපෙන්වීම යටතේ 2017.08.01 වන දින සිට මෙම නිවසේ වැඩ ආරම්භ කර මේ වන විට ඉදිකිරීම් කටයුතු 60% ක ප්‍රමාණයක් නිමකර ඇති අතර, ඉදිරියේදී එම විරුවාගේ බිරිඳ වෙත භාරදීමට නියමිතව ඇත.



# 16 [සෙවි] ශ්‍රීලපාහ බළඇණි පුහුණුවීම්



මෙම ඒකක බළඇණි පුහුණු පාඨමාලාව 2017.07.06 වන දින සිට 2017.08.29 වන දින දක්වා 57 වන සේනාංක බළඇණි පුහුණු පාසල අම්පකාමම් හිදී ඉතාමත් සාර්ථකව සිදු කරන ලදී. මෙහි ආරම්භක දේශනය 57 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරල් එච්ජේඑස් ගුණවර්ධන ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පිඑස්සී ජ්‍යෙෂඨ නිලධාරි තුමන් විසින් සිදුකරන ලදී.

බළඇණි පුහුණු කාලසීමාව තුලදී හඨ පිරිස් විසින් ඉතා උනන්දුවෙන් හා උද්යෝගීමත්ව තම පුහුණුවීම් වල නියැලුණු අතර, රණබිම් ක්‍රම, සිතියම් කියවීම, යුධ උපක්‍රම, අභ්‍යන්තර ආරක්‍ෂක රාජකාරි හා ඊට අදාල නිදර්ශනයන් ද ආරාධිත දේශන වලටද සහභාගී වීමට සෙබළුන්ට අවස්ථාව හිමිවිය.

බළඇණි පුහුණු පාඨමාලාවේ සමස්ථ ශූරතාවය දිනා ගැනීමට "සී" කණ්ඩායම සමත් වු අතර, දක්‍ෂතම වෙඩික්කරු ලෙස "ඒ" කණ්ඩායමේ නි/9804 කපිතන් ඒපීඑස්පී නන්දසේන ශ්‍රීලපාහ ද, හොඳම ශාරීරික යෝග්‍යතාවය සහ පාඨමාලාවේ සෑම අතින්ම අතිශූර සෙබලා ලෙස "සී" කණ්ඩායමේ සෙ/16ඩී00316 කෝප්‍රල් මධුසංක ඩීඑම්ඩී ද සමත් විය.

අණදෙන නිලධාරී තුමන්ගේ පූර්ණ අධික්‍ෂණය හා මඟ පෙන්වීම යටතේ මෙම පාඨමාලාව ඉතාමත් සාර්ථකව නිමවිය.





**බළඇණි පුවත් | 16 (සේවි) ශ්‍රීලපාහ**





දක්ෂතම වෙඩික්කරු
නි/9804 කපිතන් ඒපීඑස්පී නන්දසේන ශ්‍රීලපාහ

සෑම අතින්ම අතිශූර සෙබලා
සෙ/16ඩී00316 කෝප්‍රල් මදුෂංක ඩීඑම්ඩී





**බළඇණි පුවත් | 19 ශ්‍රීලපාහ**

# අංක 72 බලඇණි ආධාරක අවි පාඨමාලාවේ ප්‍රථම ස්ථානය

බළඇණි ආධාරක අවි පාඨමාලාව අංක 72 පාබල පුහුණු මධ්‍යස්ථානය මින්නේරිය වෙතින් 2017.05.16 වන දින සිට 2017.08.19 වන දින දක්වා පවත්වන ලදී. එම පාඨමාලාව සඳහා සියළුම රෙජිමේන්තු නියෝජනය කරමින් යුද හමුදා නිලධාරින් 22ක්, ගුවන් හමුදා නිලධාරියෙකු, නාවික හමුදා නිලධාරියෙකු හා විශේෂ කාර්ය බලකා නිලධාරි 02 ක් සහභාගී වූහ. ශ්‍රීලපාහ රෙජිමේන්තුව නියෝජනය කරමින් නි/68832 කපිතන් ඩීඑල්පී වැලිගම ශ්‍රීලපාහ නිලධාරි සහභාගී වූ අතර, පාඨමාලාව හැදෑරූ සියළුම නිලධාරින් අභිබවා ප්‍රථම ස්ථානය හිමිකර ගැනීමට එම නිලධාරි සමත් විය. පාඨමාලාවෙන් දස්කම් දක්වන ශ්‍රී ලංකා යුධ හමුදා රෙජිමේන්තු අතුරින් ශ්‍රී ලංකා පාබල හමුදා රෙජිමේන්තුවට හා 19 ශ්‍රීලපාහ ඒකකයට කීර්තියක් ලබාදුන් මෙම නිලධාරි වෙත අප සැම සුභ පතන්නෙමු. ඉදිරියේදී ද මෙවැනි ජයග්‍රහන ලබාගැනීමෙන් ඒකකයට හා රෙජිමේන්තුවට අභිමානයක් ගෙන ඒමට ශක්තිය හා ධෛර්යය ලැබේවායි ශ්‍රීලපාහ රෙජිමේන්තු අධිපති තුමන් ප්‍රමුඛ සියලුම නිලයින් මෙසේ ප්‍රාර්ථනා කරන්නෙමු.



# පුහුණුවෙන් ලද නිපුණත්වයෙන් අභිමානය රැකගත් 20 ශ්‍රීලපාහ

## බළඇණි පුහුණු උපදේශක සංස්කරණ පාඨමාලාවේ ප්‍රථම ස්ථානය



2017 ජුලි 01 සිට ජුලි 31 දක්වා යුහපූපා මාදුරුඔය හි පැවති බළඇණි පුහුණු උපදේශක සංස්කරණ පාඨමාලාවට සහභාගී වූ නි/69201 කපිතන් කේඩබ්ලිව්සී කුමාර ශ්‍රීලපාහ යන නිලධාරි දිවයිනේ සෑම පුහුණු පාසලකින්ම සහභාගී වූ නිලධාරීන් 07 දෙනෙකු හා සෙසුනිලයින් 135 දෙනෙකු අභිබවා ප්‍රථම ස්ථානය හිමිකර ගැනීමට සමත් විය.

## කණ්ඩ අවි උපදේශක පාඨමාලාවේ ප්‍රථම ස්ථානය



2017 අප්‍රේල් 28 සිට ජුලි 27 දක්වා පාබල පුහුණු මධ්‍යස්ථානය මින්නේරියෙහි පැවති කණ්ඩ අවි උපදේශක පාඨමාලා අංක 06 පාඨමාලාවට සහභාගී වූ සෙබළුන් 29 දෙනෙකු අභිබවා ප්‍රථම ස්ථානය ලබාගැනීමට සෙ/318864 කෝප්‍රල් ප්‍රසාද් පීජීඑස් යන කොනොනි හට හැකි වූ අතර, එයින් ලද දැනුම සහෝදර සෙබලුන්ට ද ලබාදී උපදේශක මඩුල්ලක් සකසා 66 සේනාංකයේ බපුපාහි බළඇණි පුහුණුවීම් පාඨමාලාව හදාරනු ලබන 18 (සෙව්) ගරෙ අයවලුන් වෙත ලබාදීමට කටයුතු කරන ලදී. මෙම කාර්යයෙහි මඟ පෙන්වන්නා හා ප්‍රධාන උපදේශකයා වශයෙන් මෙම කොනොනි දැනට කටයුතු කිරීම ප්‍රශංසනීය වූවකි.

## විද්‍යුත් සංග්‍රාමික පාඨමාලාවේ ප්‍රථම ස්ථානය



මෙම ඒකකයට අයත් සෙ/329071 ලාකෝ සේනානායක පීඑච් යන කොනොනි විද්‍යුත් සංග්‍රාමික පාඨමාලා අංක 30 යටතේ 2017 මැයි මස 30 සිට ජුලි මස 19 දක්වා කාලසීමාව තුල සංඥා පුහුණු පාසල බුවැලිකඩ වෙතින් හදාරන ලද අතර, මෙම පාඨමාලාව විවිධ බළකායන්ට අයත් යුධ හමුදා සාමාජිකයින් 11 දෙනෙකු ද, නාවික හමුදා සෙබලුන් 07 දෙනෙකුද අතුරින් ප්‍රථම ස්ථානය ලබාගැනීමට සමත් වී ඇත. පාබල සෙබලුන්ට මෙම පාඨමාලාව ආවේණික නොවුවද සුදුස්සන් අභිබවා එම පාඨමාලාවේ ප්‍රථම ස්ථානය ලබාගැනීම සුවිශේෂී වූ ජයග්‍රහණයකි.

# බළඇණි දින සැමරුමට ලේ පරිත්‍යාගයක්!



ඒකකයට වසර අටක් සපිරෙන 2017.07.23 වන දින මුලතිව් මහ රෝහලේ ප්‍රතිකාර ලබන ගැබිණි මව්වරුන්, තැලසීමියා හා පිළිකා රෝගීන් ඇතුළු හදිසි ශල්‍යකර්ම වලට භාජනය වීමට සිටින රෝගීන් සඳහා අවශ්‍ය ලේ පරිත්‍යාග කිරීමේ මහඟු පුණ්‍යකර්මයක් 23 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් ටීඑල්එම් චන්ද්‍රසේකර ආර්ඩබ්ලිව්පී පීඑස්පී ශ්‍රීලපාහ ගේ ප්‍රධානත්වයෙන් බළඇණි මූලස්ථානයේදී පැවැත් විය.

මෙම පිංකම සඳහා 59 සේනාකය, 591 බළසේනා මූලස්ථානය, 24 වන සිංහ රෙජිමේන්තුව, මුලතිව් පොලිස් ස්ථානය නියෝජනය කරමින් නිලධාරින් සහ සෙසුනිලයින් විශාල පිරිසකගේ පූර්ණ දායකත්වය නොඅඩුව ලැබිණි. මෙම උතුම් සත්කාරය මුලතිව් මහ රෝහලේ ලේ බැංකු වෛද්‍ය කාර්යය මණ්ඩලයේ පූර්ණ මෙහෙයවීම මත සිදුවිය.







මෙම ලේ දන් දීමේ වැඩසටහන සඳහා සහභාගී වූ මුලතිව් මහ රෝහලේ කාර්යයමණ්ඩලය සමඟ ඒකක අණදෙන නිලධාරි තුමන් ඇතළු අනෙකුත් නිලධාරීන්

# තනතුරෙන් නික්ම යන වන්නි ආඥාපති වෙත උත්තමාචාරය පිරිනැමීම



වන්නි ආරක්ෂක සේනා මූලස්ථානයේ හිටපු ආඥාපති මේජර් ජෙනරල් ජේආර් කුලතුංග ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි එම තනතුරෙන් නික්මයාම වෙනුවෙන් 2017.07.21 වන දින මෙම ඒකක හට පිරිස් යොදවා අභිමානවත් කඳවුරු මුරයක් සහ සම්මාන පෙළපාලියක් පිරිනමන ලද අතර, ඒ වෙනුවෙන් නික්ම ගිය වන්නි ආඥාපති තුමන් විසින් ඒකකය වෙත ප්‍රශංසා කරන ලදී. එම ධූරයෙන් නිකම ගිය ආඥාපති තුමන්ගේ ඉදිරි යුද හමුදා ජීවිතය සර්වප්‍රකාරයෙන් සාර්ථක වේවායි අප මෙසේ සුභ පතන්නෙමු.

## 213 වන බලසේනා මූලස්ථානයේ බලසේනාධිපතිගේ ඒකක සංචාරය



2017. 07. 29 වන දින රාජකාරි භාරගැනීමෙන් අනතුරුව ප්‍රථමයෙන්ම මෙම ඒකකය වෙත කඳවුරු සංචාරයක නිරත වූ 213 බලසේනාධිපති කර්නල් කේඩබ්ලිව්ඩබ්ලිව් රත්නායක ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් වෙත කඳවුරු මුරයක් පිරිනැමීමෙන් අනතුරුව, ඒකකයේ අණදෙන නිලධාරි ලුතිතන් කර්නල් බීඩබ්ලිව්එම්සී බෙලිගස්වත්ත ආර්එස්පී ශ්‍රීලපාහ ඇතුළු අනෙකුත් නිලධාරින් විසින් මහත් ගෞරවයෙන් යුතුව පිළිගන්නා ලදී.

තම සංචාරය සිහිගැන්වීම වෙනුවෙන් එතුමන්ගේ සුරතින් කඳවුරු භූමියේ අඹ පැලයක් රෝපණය කිරීමෙන් අනතුරුව 24 ශ්‍රීලපාහ දේශණ ශාලාවේදී බලසේනාධිපති තුමන් විසින් සිදුකල දේශනයෙන් පසු තම සංචාරය නිම කරන ලදී.

# අන්තර් ඒකක එල්ලේ තරඟාවලියේ විශිෂ්ඨයන් වූ 25 ශ්‍රීලපාහ



2017 වර්ෂයේ රෙජිමේන්තු ක්‍රීඩා සැලැස්මට අනුව 9 (සේවා) ශ්‍රීලපාහ ඒකකයේ සංවිධානයෙන් යුතුව අන්තර් ඒකක එල්ලේ තරඟාවලිය අගෝස්තු මස 16 හා 17යන දිනයන් වලදී කැළණිය කල්‍යාණිපුර සීවලී ක්‍රීඩාංගනයේදී පැවැත්වූ අතර, මෙම තරඟාවලිය සඳහා ශ්‍රීලපාහ ඒකක 14 ක් නියෝජනය කරන ලදී.

මෙහිදී 25 ශ්‍රීලපාහ එල්ලේ කණ්ඩායම ආරම්භයේ සිටම ඉතා දක්ෂ ලෙස ක්‍රීඩා කරමින් 19 හා 26 ශ්‍රීලපාහ කණ්ඩායම් පරාජය කරමින් දැඩි ස්ථාවරයක් ගොඩනගා ගත්හ. පසුව 14 (සේවා) ශ්‍රීලපාහ ඒකකය සමඟ පැවති අර්ධ අවසන් පූර්ව තරඟය තියුණු මුහුණුවරක් ගත්ත ද 25 ශ්‍රීලපාහ කණ්ඩායමේ දක්ෂතා අභිබවා යාමට ඔවුන් හට අවස්ථාව නොලැබුණි.

2017 අගෝස්තු 19 දින අවසන් මහා තරඟය පැවැත්වීම සඳහා 25 ශ්‍රීලපාහ කණ්ඩායමත්, 12 ශ්‍රීලපාහ කණ්ඩායමත් සුදුසුකම් ලබා තිබුණි. බෝල් අවුට් ක්‍රමයට පවත්වන ලද මෙම තරඟයේදී පළමු භාගය අවසානයේදී 12 ශ්‍රීලපාහ කණ්ඩායමේ සියලු දෙනා දැවී ලකුණු 5 ක් ලබා ගැනීමට සමත් විය. පසුව 25 ශ්‍රීලපාහ කණ්ඩායම තියුණු තරඟයකින් පසු ලකුණු සීමාව පසු කර ජයග්‍රහනය ලබා ගන්නා ලදී.

මෙම තරඟාවලියේදී වැඩිම ලකුණු ලාභියා ලෙස සෙ/322901 ලාකෝ එදිරිසිංහ ඊඩීඑස්ටී සම්මාන හිමිකරගත් අතර, තරඟාවලියේ වීරයා හා වැඩිම උඩ පන්දුලාභියා වශයෙන් 25 ශ්‍රීලපාහ ඒකකයේ කණ්ඩායම් නායක සෙ/313194 කෝප්‍රල් කුලරත්න පීජීසී සම්මාන හිමිකරගන්නා ලදී. ඔවුන්ගේ ඉදිරි ක්‍රීඩා ජීවිතය හා යුද හමුදා ජීවිතය වෙනුවෙන් ඒකක අණදෙන නිලධාරී තුමා ඇතුලු සියලුම නිලයින්ගේ සුභාශිංසන මෙලෙස පිරිනමන්නෙමු.

# සුභ උපන් දිනයක් වේවා






2017 ජූලි මස 08 වන දින
පළමු උපන් දිනය සැමරූ රෙජිමුබ
ශ්‍රීලපාහට අයත් සෙ/320327
කෝප්‍රල් රත්නායක ආර්එම්වීඑස් ගේ
ආදරණීය දියණිය

**හංසනි ඉමන්දියා**



2017 ජූලි මස 12 වන දින
2 වන උපන් දිනය සමරන 12 ශ්‍රීලපාහ
ඒකකයට අයත් සෙ/320101
කෝප්‍රල් ප්‍රියදර්ශන බීජීආර් ගේ
ආදරණීය දියණිය

**චතුමි ශෙවන්‍යා**



2017 ජූලි මස 14 වන දින
1 වන උපන් දිනය සමරන 15 ශ්‍රීලපාහ
ඒකකයට අයත් සෙ/324552
කෝප්‍රල් විමලරත්න එම්ඒසීඑන් ගේ
ආදරණීය දියණිය

**නතිකා දිනිත්මි**



2017 අගෝස්තු මස 13 වැනි දින
1 වැනි උපන් දිනය සමරන 4 ශ්‍රීලපාහ
ඒකකයට අයත් සෙ/323003
කෝප්‍රල් ඉන්දික ඩබ්එල්ඩී ගේ
ආදරණිය පුතණුවන්

**ඉමන්දිව් නිම්ලක**



2017 සැප්තැම්බර් මස 09 වැනි දින
1 වැනි උපන් දිනය සමරන 23 ශ්‍රීලපාහ
ඒකකයට අයත් සෙ/327898
ලාකෝ සෝමරත්න එස්එස්ඒ ගේ
ආදරණිය පුතණුවන්

**කවිදු මධුශාන්**



2017 සැප්තැම්බර් මස 17 වැනි දින
3 වැනි උපන් දිනය සමරන 8 ශ්‍රීලපාහ
ඒකකයට අයත් සෙ/320788
කෝප්‍රල් ජයරත්න එච්එම්පී ගේ
ආදරණිය දියණිය

**මයුරි ප්‍රමෝද්‍යා**



**නිවැරදි විසඳුම් පත් 2017 නොවැම්බර් මස 10 වන දිනට පෙර එවිය යුතුය. තරඟ කූපනය සහ කොන්දේසි මෙහි සඳහන් කර ඇත.**

## තරඟ කොන්දේසි

1. ප්‍රහේලිකාව පසුපස ඇති අයදුම්පත සම්පූර්ණ කර පහත ලිපිනයට තැපැල් කළ යුතුයි.
2. මෙම තරඟයට වයිට් හැකල් සඟරාවේ කාර්ය මණ්ඩලයට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින් හට සහභාගි විය නොහැක.
3. පළමුවන, දෙවන හා තුන්වන ජයග්‍රහණ හිමිකර ගන්නා ජයග්‍රාහකයින් හට පිළිවෙළින් රු.1000/-, රු.750/-, රු.500/- වශයෙන් මුදලින් තෑගි ලබා දීමට තීරණය කර ඇත.
4. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය ලෙස සැලකේ.
5. නිවැරදි පිළිතුරු පත් අතරින් කුසපත් ඇදීමෙන් තෝරා ගනු ලබන ජයග්‍රාහකයින් තිදෙනෙකු සඳහා පමණක් තෑගි ලබා දීම සිදු කෙරේ.
6. පිළිතුරු පත් එවන ලියුම් කවරයේ වම් පස උඩ කෙලවරේ "**වයිට් හැකල් ප්‍රහේලිකා අංක** "70" යනුවෙන් සඳහන් කළ යුතුයි.

*ලිපිනය : වයිට් හැකල් කර්තෘ,*
*වයිට් හැකල් ප්‍රකාශන අංශය,*
*රේම ශ්‍රීලපාහ, යුද්ධ හමුදා ජනපදය,*
*පනාගොඩ, හෝමාගම.*

## වයිට් හැකල් ප්‍රහේලිකාව අංක 70

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 7 | | 6 | 5 | | | 4 | 8 |
| 3 | 4 | | 2 | | 9 | | 1 | 6 |
| | | | | 1 | 4 | | | |
| 8 | 5 | | 9 | 7 | | | 2 | 3 |
| 7 | | 4 | | 2 | | 8 | | 9 |
| | 2 | 9 | | | | 1 | 7 | |
| | | | 4 | 9 | | | 8 | |
| 2 | 9 | | 1 | | 7 | 6 | 5 | |
| 4 | 1 | | | 6 | 5 | | | |

## ප්‍රහේලිකාව ගැන

1. කුඩා කොටු නවයකින් සමන්විත වූ විශාල කොටුවක් නිර්මාණය වී ඇති අතර එවැනි කොටු නවයකින් මෙම ප්‍රහේලිකාව සම්පූර්ණ වී ඇත.

2. කුඩා කොටු නවය තුළ 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතු අතර, එය පිළිවෙලකට අවශ්‍ය නොවේ.


3. කුඩා කොටු නවය ඇතුළත් විශාල කොටු නවය සම්පූර්ණ කළ පසු 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතුය.

4. ඉහත සඳහන් පරිදි ප්‍රහේලිකාව සම්පූර්ණ කළ පසු සිරස් සහ තිරස්, හරස් අතට 1 සිට 9 දක්වා වූ ඉලක්කම් නවය ඇතුළත් විය යුතු අතර පිළිවෙලකට අවශ්‍ය නොවේ.

5. කුඩා කොටු නවය ඇතුළත් විශාල කොටුවක හා තිරස් සිරස් හා හරස් අතට එකතු වේ අගය 45 ක් විය යුතුය.

6. කුඩා කොටුවක් තුළ හා සිරස්, තිරස් හා හරස් අතට අංක යෙදීමේදී එකම අංකය දෙතැනක සඳහන් නොකළ යුතුයි. සඳහන් කළ හැක්කේ එක් වරකි.

## ජීවිතයට වදනක්....



## වයිට් හැකල් ප්‍රහේලිකාව අංක 70

### කූපනය

අංකය:

නිලය:

නම:

රාජකාරි ලිපිනය :

ඒකකය :

ජාතික හැඳුනුම්පත් අංකය :

යුහ හැඳුනුම්පත් අංකය :

**නිවැරදි විසඳුම්පත් මෙම කූපනය සමඟ අප වෙත එවන්න**


## දැන්වීමයි

**පාබල හමුදා සිල්වර් බියුගල්ස් සංගීත කණ්ඩායම වෙත ඉංග්‍රීසි, හින්දි, දෙමළ හා වෙනත් භාෂා වලින් ගීත ගායන හැකියාව ඇති අයවලුන් සඳහා පුරප්පාඩු ඇත. මේ සඳහා වයස අවු: 18 - 24 ත් අතර දක්ෂතාවයන් වලින් හෙබි තරුණයන්ට අයදුම් කල හැක.**

වැඩි විස්තර සඳහා

තූර්ය වාදක කණ්ඩායම භාර නිලධාරි

**0771043192**




## නිවැරදි බස වහරමු

## අරුත් / නිරුත්

**ඩීඑෆ් කාරියකරවන මහතාගේ අරුත් නිරුත් පොත ඇසුරිණි**

### අතලොස්ස

"ඩිංග", "ස්වල්පය" යන අදහස අතලොස්සෙහි ඇත. අත්ල බොකු ගැසූ විට එහි අල්ලන ප්‍රමාණය අතලොස්ස ය. ශ්‍රී සුමංගලයෙහි අතලොසු අර්ථ කථනය වන්නේ "අල්ලට ගත හැකි ප්‍රමාණය", "ස්වල්ප" යනුවෙනි.

### අර්බුදය

ලිහන්නට බැරි ගැටය "අර්බුද" නම් වේ. වෛද්‍ය විද්‍යාවෙහි ගැට දෙකක් ඇත. එකක් ග්‍රන්ථි නම් වේ. එය සුව කළ හැකිය. සුව කළ නොහැකි ගැටය "අර්බුද" නම් වේ. එය "පිඩකා"(පිළිකා) නමින් ද හැඳින්වේ. සාහිත්‍යයෙහි "අර්බුදය" අවුල් ජාලයකි. විසඳන්නට බැරි ගැටලුවකි. අර්බුද සංස්කෘත වචනයකි. එය දෙමළෙන් "අට්බුදම්" නම් වේ.

# දසුනේ හසුන



සිව් රඟ සෙන් හිමි යුව රජ පදවි ලද
සෙන්පති නුඹයි පරිණත බව ලොවෙන් ලද
සසල වේද මහමෙර හැමුවාට නළ
නිසල ජලය ගැඹුරුයි එය පසක් කළ

<u>හසුන</u>
මේජර් තරිඳු වීරසිංහ ශ්‍රීලපාහ

<u>දසුන</u>
වයිට් හැකල් කැමරා අංශය

2017.08.23 වන දින  ශ්‍රීලපාහ රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙත පැමිණි යුද්ධ හමුදාධිපති ලුතිතන් ජෙනරල් එන්යුඑම්එම්ඩබ්ලිව් සේනානායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යුඑස්පී පිඑස්සී ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් සමඟ සමූහ ඡායාරූපය

